# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1963/28 - 2016 අප්‍රේල් මස 20 වැනි බදාදා - 2016.04.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 9/2005.

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

48 (5) වැනි වගන්තිය යටතේ වූ නියමය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වැනි වගන්තියේ (5) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මා විසින් මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රභේදවලට අයත්වන සංචාරක හෝටල් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සහ ලියාපදිංචි සංචාරක හෝටල් සඳහා බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් අයකරනු ලබන ගාස්තු එකී උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ විය යුතු බවට මෙම නියමය මගින් නිශ්චිතව දක්වමි.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය.

2016 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ප්‍රදානය සඳහා ගෙවිය යුතු ගාස්තු***

| *I වැනි තීරය* *වර්ගය* | *II වැනි තීරය* *ලියාපදිංචි ගාස්තුව* *රු. ශත* | *III වැනි තීරය* *බලපත්‍ර ගාස්තුව* *රු. ශත* |
|---|---|---|
| (1) තරු 1 හෝටලය | 5,000.00 | 2,000.00 |
| (2) තරු 2 හෝටලය | 10,000.00 | 2,500.00 |
| (3) තරු 3 හෝටලය | 15,000.00 | 5,000.00 |
| (4) තරු 4 හෝටලය | 20,000.00 | 7,500.00 |
| (5) තරු 5 හෝටලය | 25,000.00 | 10,000.00 |

05 - 74/1


1A - G 23314— 56 (2016/04)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී. බී. 9/2005.

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් මත 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 50 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වැනි වගන්තිය යටතේ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජොන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය.

2016 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2016 අංක 01 දරන සංචාරක (සංචාරක හෝටල් වර්ගීකරණය කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර එකී නියෝග 2016 මැයි 20 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. සියලුම වර්ගවල සංචාරක හෝටල්වලට අදාළව 2016 අංක 01 දරන සංචාරක (සංචාරක හෝටල්වල අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම්) රීතිවල නිශ්චිතව දැක්වෙන සියලුම වර්ගවල සංචාරක හෝටල් සඳහා වන අවම නියමයන්ට ලියාපදිංචි සංචාරක හෝටල් අනුකූලවන බවට සෑම ලියාපදිංචි අයිතිකරුවකුම වග බලා ගත යුතු ය.

3. 2016 අංක 01 දරන සංචාරක (සංචාරක හෝටල් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීමේ) නියෝග යටතේ ලියාපදිංචි කර ඇති සහ බලපත්‍ර ලැබී ඇති සංචාරක හෝටලයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් "තරු" හෝටලයක් ලෙස වර්ගීකරණය කරනු ලැබිය යුතු ය.

4. (1) සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත වන (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) වර්ගීකරණ කමිටුවක් පත් කරනු ලැබිය යුතු අතර එකී වර්ගීකරණ කමිටුව අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) කමිටුවේ එක් සාමාජිකයෙක්, අධිකාරිය විසින උචිත යයි සලකනු ලබන පරිදි, ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය විමසා පත් කරනු ලැබිය යුතු ය.

(3) අධිකාරිය විසින්, (මේ නියෝගවල (2) වැනි ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර) සාමාජිකයන් අතරින් එක් අයෙකු කමිටුවේ සභාපතිවරයා ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(4) අධිකාරිය විසින් (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කමිටුවේ ලේකම්වරයෙකු පත් කරනු ලැබිය යුතු ය.

(5) කමිටුවේ සෑම සාමාජිකයෙකුම, මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම යන හේතු මත කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, පත් කළ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. කාලය ඉකුත්වීම නිසා ධුරය හැර යන කමිටුවේ යම් සාමාජිකයකු නැවත පත්කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(6) (අ) කමිටුවේ රැස්වීම් තුනකට අඛණ්ඩව නොපැමිණෙන ; හෝ

(ආ) මෙම නියෝග යටතේ පවත්වනු ලබන අනුයාත පරීක්ෂා කිරීම තුනකට සහභාගී නොවන,

කමිටුවේ යම් සාමාජිකයෙක් කමිටුවේ සාමාජිකයකු වීම අවසන් විය යුතු ය.

(7) තම ධුරකාලය අවසන්වීමට පෙර සාමාජිකයෙකු වීම අවසන් වන යම් තැනැත්තකුගේ අනුප්‍රාප්තිකයා වශයෙන් කමිටුවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලබන යම් තැනැත්තෙක් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධුරකාලය සඳහා ධුර දැරිය යුතු ය.

(8) කමිටුවේ සාමාජිකයන්ට සහ ලේකම්වරයාට සංචාරක විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අධිකාරය විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(9) මෙම නියෝගවල විධිවිධානවලට යටත්ව කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය කමිටුව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(10) කමිටුවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ කමිටුවේ සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් කමිටුවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සළකනු නොලැබිය යුතු ය.

5. (1) ලේකම්වරයා විසින් කමිටුවේ සභාපතිවරයාගේ විධානය යටතේ කමිටුවේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(2) කමිටුවේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් හතරදෙනෙකු විය යුතු ය.

(3) කමිටුවේ සෑම රැස්වීමකදීම එහි සභාපතිවරයා එහි මුලසුන දැරිය යුතු අතර කමිටුවේ සභාපතිවරයා යම් රැස්වීමකට නොපැමිණි සිට 4 වැනි නියෝගයේ (2) වැනි ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතරින් යම් අයෙකු සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය.

(4) කමිටුව වෙත යොමු කරන ලද යම් විෂය කරුණක් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කමිටුවේ යම් සාමාජිකයකු හෝ එකී යොමු කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවය විසින් හෝ එම පාර්ශවය වෙනුවෙන් එම කරුණ සම්බන්ධයෙන් අදහස් විමසා ඇති යම් සාමාජිකයකු එම යොමු කිරීම සම්බන්ධයෙන් තීරණය කරනු ලබන කමිටුවේ යම් රැස්වීමකට සහභාගී නොවිය යුතු ය.

6. (1) යම් හෝටලයකට වෙන්කර දිය යුතු උචිත තරු පංතිය තීරණය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කමිටුව වෙත යොමු කිරීමක් කළ යුතු ය.

(2) මේ නියෝගය යටතේ කමිටුවේ වෙත ඉදිරිපත් කරනු ලබන සෑම යොමු කිරීමක් ම එම යොමු කිරීමේ විෂය කරුණ පිළිබඳව සම්පූර්ණ සහ සංක්ෂිප්ත ප්‍රකාශයක් ද සහිතව ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(3) සෑම යොමු කිරීමක්ම කමිටුවේ සභාපතිවරයා අමතා ඉදිරිපත් කළ යුතු අතර එම සභාපතිවරයා විසින් එම යොමු කිරීම ලේකම්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

7. (1) කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන සෑම යොමු කිරීමක්ම පරීක්ෂා කිරීම සහ තීරණය කිරීම සඳහා කමිටුව විසින් දිනයක් නියම කරනු ලැබිය යුතු අතර ඒ පිළිබඳ දැන්වීමක් කමිටුව විසින් එහි ලේකම්වරයා හරහා එම යොමු කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

(2) කමිටුව විසින් තීරණය කළ යුතු යම් යොමු කිරීමක් පිළිබඳ තීරණය එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු අතර ඡන්දවල සාමානත්වයක් ඇති විට අවස්ථාවෝචිත පරිදි කමිටුවේ සභාපතිවරයාට හෝ රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) කමිටුව විසින් තීරණය කරනු ලබන එක් එක් යොමු කිරීමක් සම්බන්ධයෙන් සහ කමිටුවේ රැස්වීම් පිළිබඳ වාර්තාවක් ලේකම්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

8. (1) 7 වැනි නියෝගය යටතේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද යම් යොමු කිරීමක් සම්බන්ධයෙන් වූ කමිටුවේ තීරණය පිළිබඳ දැන්වීමක් අධ්‍යක්ෂක-ජනරාල්වරයා වෙත භාර දීමට කමිටුව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) යොමු කිරීමට අදාළ විෂය කරුණ වූ සංචාරක හෝටලය සම්බන්ධයෙන් කමිටුවේ තීරණය ලැබීමේ දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එම තීරණයට අනුකූලව වර්ගීකරණ සහතිකයක් ලියාපදිංචි අයිතිකරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

9. මෙම නියෝගවල 1 වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන පන්තියට අයත් සෑම ලියාපදිංචි සංචාරක හෝටලයක්ම එම උපලේඛනයේ II වැනි සහ III වැනි තීරවල අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති ලකුණු සීමාව අතර ලකුණු ලබා ගත යුතු ය.

10. තරු එකේ හෝ තරු දෙකේ සංචාරක හෝටලයක් වශයෙන් සුදුසුකම් ලැබීමට අදහස් කරන සෑම ලියාපදිංචි අයිතිකරුවකුම මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

11. තරු තුනේ, තරු හතරේ හෝ තරු පහේ සංචාරක හෝටලයක් ලෙස සුදුසුකම් ලැබීමට අදහස් කරන සෑම ලියාපදිංචි අයිතිකරුවකුට ම මෙහි III වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන අවම සුදුසුකම් තිබිය යුතු ය.

12. (1) යම් වර්ගයකට අයත් තරු ප්‍රමාණයක සංචාරක හෝටලයක් ලෙස සුදුසුකම් ලැබීමට අදහස් කරන සෑම ලියාපදිංචි අයිතිකරුවකුටම IV වැනි උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් පහසුකම් සඳහා IV වැනි උපලේඛනයේ III වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ලකුණු ලබා දිය යුතු ය.

(2) මෙම නියෝගය ප්‍රකාරව තරු පන්තිවල සංචාරක හෝටල් සම්බන්ධයෙන් කරනු ලබන සෑම වර්ගීකරණයක්ම අන්‍යාකාරයකට තීරණය කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

(3) සෑම අවුරුදු තුනක කාලයක් අවසන් වීමේ දී තරු පන්තිවලට අයත් හෝටලයක් නැවත වර්ගීකරණය කරනු ලැබිය යුතු ය.

13. (1) කමිටුව වෙත ඉදිරිපත් කරන ලද යම් යොමු කිරීමක් සම්බන්ධයෙන් තීරණයකට එළඹීමේ කාර්ය සඳහා කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකුට නොඅඩු පිරිසක් විසින් පරීක්ෂා කිරීමක් සිදු කළ යුතු අතර, එම සාමාජිකයන්ට ;

(අ) කමිටුව වෙත යොමු කිරීමක් ඉදිරිපත් කර ඇත්තේ යම් සංචාරක හෝටලයක් සම්බන්ධයෙන් ද එම සංචාරක හෝටලයට ඇතුළු වී සෝදිසි හා පරීක්ෂා කිරීම කළ හැකි ය.

(ආ) අදාළ මුදල් ගෙවීමෙන් පසු එම සංචාරක හෝටලය මගින් සපයනු ලබන ආහාර හෝ බීම වර්ග පරිභෝජනය කළ හැකි ය.

(2) කමිටුවේ සාමාජිකයන් විසින් එම පරීක්ෂණය සිදු කිරීමේ දී ඔවුන්ට අවශ්‍ය වන සියලු පහසුකම් ලබා දීම ලියාපදිංචි අයිතිකරුගේ හෝ හෝටලය භාරව සිටින තැනැත්තාගේ කාර්යය වන්නේ ය.

14. (1) (2) වැනි ඡේදය යටතේ තත්කාර්ය සඳහා යොමු කිරීමක් ලැබීමේ දී සංචාරක හෝටලයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද වර්ගීකරණ සහතිකයක් කවර හෝ අවස්ථාවක දී අවස්ථාවෝචිත පරිදි සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

(2) වර්ගීකරණ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති යම් සංචාරක හෝටලයක් පිළිබඳව අධ්‍යක්ෂක-ජනරාල්වරයා විසින් තම මෙහෙය වීමෙන්ම හෝ තත්කාර්ය සඳහා ඔහු වෙත ඉදිරිපත් කරන ලද නියෝජනයක් මත විමර්ශනයක් කරනු ලැබිය හැකි අතර වර්ගීකරණ සහතිකය සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම අවශ්‍ය බවට සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී කමිටුවේ තීරණය සඳහා සභාපතිවරයා විසින් කමිටුව වෙත යොමු කිරීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

15. (1) තරු පන්තියේ සංචාරක හෝටලයක් ලෙස වර්ගීකරණය කරනු ලැබූ සංචාරක හෝටලයකට -

(අ) එම සංචාරක හෝටලය තරු පහ හෝටලයක් ලෙස වර්ගීරකණය කරනු ලැබුවහොත්, එම හෝටලයේ නම සමග තරු පහ සංචාරක හෝටලයක් නියෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ලාංඡනයක් භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට එම සංචාරක හෝටලයට හිමිකම් තිබිය යුතු ය.

(ආ) එම සංචාරක හෝටලයක් තරු හතර සංචාරක හෝටලයක් ලෙස වර්ගීකරණය කරනු ලැබුවහොත්, එම හෝටලයේ නම සමග තරු හතර සංචාරක හෝටලයක් නියෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ලකුණක් භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට එම සංචාරක හෝටලයට හිමිකම් තිබිය යුතු ය.

(ඇ) එම සංචාරක හෝටලය තුරු තුන සංචාරක හෝටලයක් ලෙස වර්ගීකරණය කරනු ලැබුවහොත්, එම හෝටලයේ නම සමග තරු තුන සංචාරක හෝටලයක් නියෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ලකුණක් භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට එම සංචාරක හෝටලයට හිමිකම් තිබිය යුතු ය.

(ඈ) එම සංචාරක හෝටලය තරු දෙක සංචාරක හෝටලයක් ලෙස වර්ගීකරණය කරනු ලැබුවහොත්, එම හෝටලයේ නම සමග තරු දෙක සංචාරක හෝටලයක් නියෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ලකුණ භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට එම සංචාරක හෝටලයට හිමිකම් තිබිය යුතු ය.

(ඉ) එම සංචාරක හෝටලය තරු එකේ සංචාරක හෝටලයක් ලෙස වර්ගීකරණය කරනු ලැබුවහොත්, එම හෝටලයේ නම සමග තරු එකේ සංචාරක හෝටලයක් නියෝජනය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ලකුණ භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට එම සංචාරක හෝටලයට හිමිකම් තිබිය යුතු ය.

16. (1) අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ ලිඛිත අවසරය යටතේ ක්‍රියාකරන අධිකාරියේ යම් සාමාජිකයෙකු විසින් හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ ලිඛිත අවසරය යටතේ ක්‍රියාකරන අධිකාරියේ යම් නිලධරයකු විසින් -

(අ) පූර්ව දැනුම්දීමක් ඇතිව හෝ නොමැතිව යම් සංචාරක හෝටලයකට ඇතුළු වී මෙම නියෝගවල විධිවිධානවලට අනුකූලව එම හෝටලය පවත්වාගෙන යන්නේ ද යන්න දැන ගැනීමේ කාර්ය සඳහා එම පරිශ්‍රය පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ආ) කවර හෝ අවස්ථාවක දී ලියාපදිංචි අයිතිකරුගේ හෝ ඔහු වෙනුවෙන් ලියාපදිංචි සංචාරක හෝටලය භාරව සිටින වෙනත් යම් තැනැත්තකුගේ සන්තකයේ, භාරකාරත්වයේ හෝ පාලනයට යටත්ව ඇති යම් පොතක්, දැන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ලියාපදිංචි අයිතිකරු හෝ එම ලියාපදිංචි සංචාරක හෝටලය භාරව සිටින තැනැත්තන්ට නියම කරනු ලැබිය හැකි ය ;

(ඇ) එවැනි යම් පොතක්, දැන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කිරීම, එවැනි පොතකින්, දැන්වීමකින්, වාර්තාවකින්, ලැයිස්තුවකින් හෝ ලේඛනයකින් පිටපත් හෝ උධෘත ලබා ගැනීම. ඒවායේ ඇති යම් කරුණක් පැහැදිලි කරන ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීම මේ පනත යටතේ හෝ මේ නියෝග යටතේ වූ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් ඔහුගේ මතය අනුව සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි යම් පොතක්, දැන්වීමක්, වාර්තාවක්, ලැයිස්තුවක් හෝ වෙනත් ලේඛනයක් තහනමට ගැනීම කළ හැකි ය ;

(ඈ) ඔහු විසින් විමර්ෂණය කරනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් එකී ලියාපදිංචි සංචාරක හෝටලයේ පරිශ්‍රයේ දී ඔහුට හමුවන සෑම තැනැත්තකුගෙන්ම හෝ එම පරිශ්‍රයේ සේවයේ නියුක්ත බවට හෝ සේවයේ නියුක්තව සිටි බවට හෝ මෙම ඡේදයේ සඳහන් යම් දෙයක සන්තකය, භාරකාරත්වය හෝ පාලනය දරන බවට විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු ඇති සෑම තැනැත්තෙකුගෙන් ම ඔහු විසින් ප්‍රශ්ණ කරනු ලැබිය හැකි ය ;

(ඉ) ඔහු විසින් නියම කරනු ලබන වේලාවක දී සහ ස්ථානයක දී ඔහු ඉදිරිපිට පෙනී සිටින ලෙස (ඈ) අනුඡේදයේ සඳහන් යම් තැනැත්තෙකුට නියම කරනු ලැබිය හැකි අතර ඔහු විසින් විමර්ශනය කරනු ලබන යම් කාරණයකට අදාළව එම තැනැත්තාගෙන් ප්‍රශ්න කළ හැකි ය.

(2) යම් හිරිහැරයකින් හෝ බාධාවකින් තොරව (1) වැනි ඡේදය යටතේ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වාගෙනයාම සඳහා එම විමර්ශනය හෝ පරීක්ෂණය පවත්වන තැනැත්තාට හෝ තැනැත්තන්ට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීම ලියාපදිංචි අයිතිකරුවකු හෝ යම් ලියාපදිංචි සංචාරක හෝටලයක් භාරව සිටින යම් තැනැත්තකුගේ කාර්යය වන්නේ ය.

(3) මේ නියෝග යටතේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරන යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත ඉල්ලීමක් කරනු ලැබීමේ දී එම තැනැත්තා හෝ තැනැත්තන් විසින් තම අනන්‍යතාව පිළිබඳ සාක්ෂි හෝ (1) වැනි ඡේදයේ සඳහන් ලිඛිත අධිකාරී බලය ඉදිරිපත් කළ යුතු ය.

(4) මේ නියෝග යටතේ යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වාගෙන යාමට බලය පැවරී ඇති තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

17. (1) 15 වැනි නියෝගයේ සඳහන් යම් ලකුණක් භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට වර්ගීකරණය කරන ලද සංචාරක හෝටලයකට හිමිකම් ඇතිනම් සහ බලය පැවරී ඇතිනම් මිස, එම වගන්තියේ සඳහන් යම් ලකුණක් එම සංචාරක හෝටලය විසින් භාවිත කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(2) 15 වැනි නියෝගයේ සඳහන් පරිදි වූ යම් ලකුණකට සමාන අනුකරණයක් හෝ යම් වංචනික ලකුණක් වර්ගීකරණය කරන ලද සංචාරක හෝලයක් විසින් භාවිත කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

(3) වර්ගීකරණය කරන ලද සංචාරක හෝටලයකට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලබා දී ඇති තරු පන්තිය හෝ ලකුණ ප්‍රදර්ශනය කිරීමකින් තොරව එම සංචාරක හෝටලය විසින් "වර්ගීරණය කරන ලද සංචාරක හෝටලය" යන වචන හෝ "තරු පන්තියේ සංචාරක හෝටලය" යන වචන ඇතුළත් නමක් භාවිත කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(4) මේ නියෝග යටතේ වර්ගීකරණය නොකරන ලද කිසිදු සංචාරක හෝටලයක් විසින් "තරු පන්තියේ හෝටලය" යන වචන හෝ එවැනි බලපෑමක් ඇති කරවන වචන භාවිතා කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ භාවිත කිරීමට හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

(5) මේ නියෝගවල කාර්ය සඳහා 15 වැනි නියෝගයේ සඳහන් යම් ලකුණක් වර්ගීකරණය කරන ලද සංචාරක හෝටලයක් විසින් හෝ හෝටලය තුළ භාවිත කරනු ලබන යම් දැන්වීමක, ලිපිද්‍රව්‍යවල, නිල ඇඳුමක, සාධන පත්‍රයක, ලේඛනයක හෝ වෙනත් යම් උපකරණයට කවර හෝ නමකින් යොදා ඇත්නම් එම හෝටලය විසින් එම ලකුණ භාවිත කරන බවට සලකනු ලැබිය යුතු ය.

18. මෙම නියෝගය යටතේ නිකුත් කරන ලද යම් නියමයකින්, දැන්වීමකින් හෝ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී නියමය, දැන්වීම හෝ තීරනය නිකුත් කිරීමේ දින සිට දින තිහක් ඇතුළත 1982 ජූලි මස 27 වැනි දින අංක 296/6 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 අභියාචන විනිශ්චයකාරී නියෝග මගින් පිහිටුවන ලද අභියාචන විනිශ්චයාධිකාරයක් වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

19. මෙම නියෝග මගින් පවරා ඇති බලතල ක්‍රියාත්මක කරන සෑම තැනැත්තකු විසින්ම තම කාර්යය ඉටු කිරීම ආරම්භ කිරීමට පෙර තම කාර්යය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් සිද්ධිමය කරුණක්, කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් තදින්ම රහස්‍යභාවය සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශනයක් අත්සන් කළ යුතු ය.

20. (1) මෙම නියෝගවල යම් විධිවිධානයක් කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් මේ නියෝගවල විධිවාධාන උල්ලංඝනය කර ඇති බවට ලැබී ඇති සාක්ෂි මත පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු අධ්‍යක්ෂ-ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක ඔහු විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කළ හැකි ය.

(අ) එම තැනැත්තාට ලිඛිතව අවවාද කිරීම ; හෝ

(ආ) එම තැනැත්තා සහතිකයක් හෝ බලපත්‍රයක් දරන තැනැත්තකු නම්, නිකුත් කර ඇති එම සහතිකය හෝ බලපත්‍රය අවස්ථාවෝචිත පරිදි, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, අත්හිටුවීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි අතර බලපත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) මෙම නියෝග යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් දරන්නකු වන ලියාපදිංචි අයිතිකරුවකුගේ යම් සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් යම් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී එම වරද සිදු කරනු ලැබුවේ තමාගේ අනු දැනුම නොමැති බවට එම අයිතිකරු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තබා නිසි උද්යෝගයෙන් කටයුතු කළ බවට එම අයිතිකරු ඔප්පු කරන්නේ නම් මිස එම ලියාපදිංචි අයිතිකරු විසින් එම වරද සිද කර ඇති බවට සළකනු ලැබිය යුතු ය.

21. (1) 1999 මාර්තු මස 11 වැනි දින අංක 1070/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1999 සංචාරක හෝටල් සංග්‍රහය මෙයින් අවලංගු කරනු ලැබේ.

(2) (1) වැනි ඡේදයේ සඳහන් නියෝග අවලංගු කිරීම නොතකා මෙම නියෝග ක්‍රියාත්මක කිරීමට පෙරාතුවම ඉහත කී අවලංගු වූ නියෝග යටතේ ප්‍රදානය කර තිබුණු වර්ගීකරන සහතිකයක්, වලංගු සහ බලාත්මක විය යුතු අතර එය මෙම නියෝග යටතේ කරන ලද ලියාපදිංචි කිරීමක් ලෙස ද, නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස ද, ප්‍රදානය කරන ලද වර්ගීකරණයක් ලෙස ද, සළකනු ලැබිය යුතු අතර, ඒ අනුව මෙම නියෝගවල විධිවිධාන එම සංචාරක හෝටලයට සහ එම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම සංග්‍රහයෙහි -

"පනත" යන්නෙන් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත අදහස් වේ.

"අධිකාරිය" යන්නෙන් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත මගින් පිහිටුවා සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අදහස් වේ.

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"සංචාරක හෝටලය" යන්නෙන් සංචාරකයන් සඳහා ගාස්තුවක් හෝ ත්‍යාගයක් මත සංචාරකයන්ට ආහාර ඇතිව හෝ නැතිව නිදා ගැනීමේ ඉඩ පහසුකම් සළසා හෝ එසේ සළසන බවට සළකනු ලබන සහ නිදන කාමර 10කට අඩු නොවන ප්‍රමාණයක් ඇති ආයතනයක් හෝ ස්ථානයක් අදහස් වේ.

## I වැනි උපලේඛනය

(9 වැනි නියෝගය)

| *සංචාරක හෝටල් වර්ගීකරණය කිරීම* | *අවම ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|
| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
| (අ) තරු 5 හෝටල් | 4,000 | 5,000 |
| (ආ) තරු 4 හෝටල් | 3,500 | 5,000 |
| (ඇ) තරු 3 හෝටල් | 3,000 | 5,000 |
| (ඈ) තරු 2 හෝටල් | 2,500 | 5,000 |
| (ඉ) තරු 1 හෝටල් | 2,000 | 5,000 |

## II වැනි උපලේඛනය

(10 වැනි නියෝගය)

*තරු 1 සහ 2 වර්ගයේ සංචාරක හෝටල් සඳහා විධානාත්මක නියම*

| *I වැනි තීරුව*<br>*අයිතමය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* |
|---|---|
| 1. නිදන කාමර | මධ්‍යම වශයේ පිහිටි ආරක්ෂිත සේප්පු හෝ තනි පුද්ගල සේප්පු තිබිය යුතු ය. |
| 2. ආපනශාලා සහ බාර් | බාර් තුළ උණු දිය සහ සිසිල් දිය මිශ්‍රණ කරාම සහිත වීදුරු සේදීමේ පහසුකම් තිබිය යුතුය. |
| 3. මුළුතැන්ගෙය | පිඟන් සේදීමේ යන්ත්‍ර නොමැති විට පිගන් සේදීමේ කාර්ය සඳහා පමණක් භාවිත කිරීමට උණු දිය සහ සිසිල් දිය මිශ්‍රණ කරාම සහිත බේසම් (Sink) තුනක් තිබිය යුතු ය. |

## III වැනි උපලේඛනය

(11 වැනි නියෝගය)

*තරු 3, 4 සහ 5 වර්ගයේ සංචාරක හෝටල් සඳහා විධානාත්මක නියම*

| *I වැනි තීරුව*<br>*අයිතමය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* |
|---|---|
| 1. හෝටල් ගොඩනැගිල්ල | 1. තරු 5 හෝටල්වල අවම වශයෙන් විසිත්ත කාමරයක් සහිත කාමර කට්ටල (Suite) තුනක් ඇතුළුව කාමර 30ක් තිබිය යුතු ය. එක් කාමර කට්ටලයක අවම වර්ගඵලය වර්ග මීටර් 65කට වඩා අඩු නොවිය යුතු ය. එක් කාමර කට්ටලයක් යාබද වැසිකිළියක් සහිත නිදන කාමරයකින් ද විසිත්ත කාමරයකින් සහ පැන්ට්‍රියක් සහිත කෑම කාමරයකින් ද සමන්විත විය යුතු ය.<br><br>2. තරු 4 හෝටල්වල අවම වශයෙන් කාමර කට්ටල (Suite) දෙකක් ඇතුළුව කාමර 30ක් තිබිය යුතු ය. එක් කාමර කට්ටලයක අවම වර්ගඵලය වර්ග මීටර් 45කට වඩා අඩු නොවිය යුතු ය. එක් කාමර කට්ටලයක් නිදන කාමරයකින් ද, යාබද වැසිකිළියක් සහිත නිදන කාමරයකින් ද විසිත්ත කාමරයකින් ද, පැන්ට්‍රියක් සහිත කෑම කාමරයකින් ද සමන්විත විය යුතු ය. |

III වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

*තරු 3, 4 සහ 5 වර්ගයේ සංචාරක හෝටල් සඳහා විධානාත්මක නියම*

| *I වැනි තීරුව* අයිතමය | *II වැනි තීරුව* පහසුකම් |
|---|---|
| | 3. තරු 3 හෝටල්වල අවම වශයෙන් කාමර කට්ටල (Suite) එකක් ඇතුළුව කාමර 30ක් තිබිය යුතු ය. එක් කාමර කට්ටලයක අවම වර්ගඵලය වර්ග මීටර් 45කට වඩා අඩු නොවිය යුතු ය. එක් කාමර කට්ටලයක් යාබද වැසිකිළියක් සහිත නිදන කාමරයකින් ද විසිත්ත කාමරයක් සහ කෑම කාමරයකින් ද සමන්විත විය යුතු ය. |
| 2. ප්‍රධාන සේවා | 1. ප්‍රධාන විදුලි සැපයුම අක්‍රිය වුවහොත් 100% අතිරේක විදුලි සැපයුමක් ලබා දිය හැකි විදුලි ජනක යන්ත්‍රයක් තිබිය යුතු ය. |
| | 2. බිම් මහළ ඇතුළුව මහල් තුනකට වඩා ඇති හෝටල්/ගොඩනැගිලි සඳහා ප්‍රමාණවත් විදුලි සෝපානයක්/සෝපාන ප්‍රමාණයක් තිබිය යුතු ය. |
| 3. නිදන කාමර | 1. ප්‍රධාන දොරටුවේ අගුල සඳහා ප්‍රධාන යතුරක්/කාඩ් ක්‍රමයක් තිබිය යුතු අතර ඇතුළතින් දෙවරක් දැමීමේ පහසුකමක් තිබිය යුතු ය. එහි හදිසි ප්‍රධාන යතුරක්/කාඩ් පතක් යොදා පිටතින් පමණක් විවෘත කළ හැකි විය යුතු ය. |
| | 2. එක් එක් නිදන කාමරය සඳහා ප්‍රමාණවත් විශාලත්වයකින් යුතු සහ යතුරු නොමැති ආරක්ෂිත සේප්පුවක් තිබිය යුතු ය. |
| 4. ආපනශාලා සහ බාර් | 1. සිසිල් කිරීමේ හෝ උණුසුම් කිරීමේ පහසුකම් සහිතව අතිරේක බාර් පහසුකම් තිබිය යුතු ය. |
| | 2. බාර් එකෙහි වීදුරු සේදීමේ යන්ත්‍රයක් තිබිය යුතු ය. |
| | 3. විෂ බීජ හරණය කළ හුවමාරු කළ හැකි ජල සැපයුම් ඒකකයකට සම්බන්ධකර ඇති අයිස් සෑදීමේ යන්ත්‍රයක් බාර් එකේ තිබිය යුතු ය. |
| | 4. විවිධ ආහාර සහ පාන වර්ග සහිත කාමර සේවා පහසුකම් තිබිය යුතු ය. |
| | 5. තරු 5 සහ තරු 4 හෝටල්වල පැය 24 පුරාම අවන්හලක් සහ/හෝ කාමර තුළදී ම ආහාර ගැනීමේ පහසුකම් තිබිය යුතු ය. |
| 5. මුළුතැන්ගෙය | 1. මුළුතැන්ගෙයි බිම පහසුවෙන් පිරිසිදු කළ හැකි වීම සඳහා ජලය අවශෝෂණය නොවන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතු අතර එහි ලිස්සන සුළු නොවිය යුතු ය. |
| | 2. පූර්ව සේදීමේ බේසමක් සහිත පිගන් සේදීමේ යන්ත්‍රයක් තිබිය යුතු අතර ඉන් හැඳි, ගෑරුප්පු, පිගන් සහ වීදුරු භාණ්ඩ යන සියලුම අයිතම සේදිය හැකි විය යුතු ය. |
| | 3. වීදුරු සේදීම සඳහා වෙනම යන්ත්‍රයක් තිබිය යුතු ය. |
| | 4. උණුසුම් වාතය සහ දුගඳ ඉවත්කිරීම සඳහා ග්‍රීස් පිල්ටර් සහිත පිටකිරීමේ ආවරණයක් ආහාර පිසීමේ උපකරණවලට ඉහළින් සවිකර තිබිය යුතු ය. |
| | 5. මුළුතැන්ගෙයි උපකරණ සේදීම වෙනමම තිබිය යුතු අතර ඒ සඳහා මිශ්‍රණ කරාමයකින් ලැබෙන උණු සහ සිසිල් ජලය සහිත මළ නොබැඳෙන බේසම් තිබිය යුතු ය. |
| 6. ගබඩා | මස්. මුහුදු ආහාර, සකසන ලද ආහාර සහ කිරි නිෂ්පාදන ගබඩා කිරීමේ දී ඒ සඳහා අපේක්ෂිත කාලයට අදාළ නිවැරදි උෂ්ණත්වවලට අනුව වෙන් වශයෙන් ගබඩා කර තිබිය යුතු ය. |

**III වැනි උපලේඛනය (සම්බන්ධිතයි)**

*තරු 3, 4 සහ 5 වර්ගයේ සංචාරක හෝටල් සඳහා විධානාත්මක නියම*

| *I වැනි තීරුව* *අයිතමය* | *II වැනි තීරුව* *පහසුකම්* |
|---|---|
| 7. සනීපාරක්ෂක නියම | තෙත කැලි කසල බැහැර කරන තුරු, පහසුවෙන් පිරිසිදු කළ හැකි මතුපිටවල් සහිත සහ උෂ්ණත්ව පාලනය කළ ස්ථානයක ගබඩා කළ යුතු ය.<br><br>මුළුතැන්ගෙය අපවිත්‍ර ජලය ග්‍රීස් සහිත කරාමයක් වෙත යොමු කළ යුතු අතර එහි එකතුවන ග්‍රීස් නිතර පවිත්‍ර කර ඉවත් කළ යුතු ය. |
| 8. රියදුරන්ගේ පහසුකම් | රියදුරන්ගේ භාවිතය සඳහා වෙන් වූ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් තිබිය යුතු ය. |
| 9. කාර්ය මණ්ඩලය | අවශ්‍ය නම් ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් විදේශීය භාෂා කථා කළ හැකි දෙදෙනෙක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කාර්ය මණ්ඩලයේ සිටිය යුතු ය. අමුත්තන්ගේ සම්බන්ධතා නිලධාරීන් ඇතුළු පිළිගැනීම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ඉතා හොඳ ඉංග්‍රීසි භාෂා දැනුමක් තිබිය යුතු ය. |

(12 වැනි නියෝගය)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *I වැනි තීරුව* *ප්‍රදේශය* | *II වැනි තීරුව* *පහසුකම්* | *III වැනි තීරුව* *ලකුණු* |
|---|---|---|
| 1. පිහිටීම | 1. සුඛෝපභෝගී හෝටලයකට යෝග්‍ය ප්‍රවේශ මාර්ගයක්, පිවිසුමක් පිටාවක් සහ පරිසරයක් තිබිය යුතු ය. | 75 |
| | 2. හෝටලයේ හෙක්ටයාරයකට ඇති ආගන්තුකයන්ගේ කාමර ප්‍රමාණය, මහල් ප්‍රමාණය හෝටලයේ කාර්ය සඳහා අනුකූල විය යුතු ය. ජනසනත්වය වැඩි ප්‍රදේශහෙක්ටයාර් එකකට කාමර 120ක් ද මධ්‍යම ජනසනත්වයකින් යුතු ප්‍රදේශවල හෙක්ටයාරකයට කාමර 60ක් ද අඩු ජනසනත්වයකින් යුතු ප්‍රදේශවල හෙක්ටයාර එකකට කාමර 24ක් ද වන පරිදි විය යුතු ය. | 50 |
| | 3. ගෙවතු අලංකරණය සහ ගස් කොළන් සහිත ප්‍රදේශය මගින් සාමාන්‍ය පෙනුම වර්ධනය කළ යුතු ය. | 50 |
| | 4. හෝටලයේ කාර්ය සඳහා අනුකූලවන පරිදි අමුත්තන්ගේ විවේය සඳහා (නම්කළ ක්‍රියාකාරකම්, ගෙවත්ත/ඩෙක් ප්‍රදේශය හැර) ඉතා හොඳ තත්වයේ ගෘහ භාණ්ඩ විශාල ප්‍රමාණයක් සහිතව ප්‍රමාණවත් ඉඩක් තිබිය යුතු ය. | 25 |
| | 5. අදාළ ස්ථානයේ පසුබිම් ශබ්ද මට්ටම දිවා කාලයේ (ඩෙසිබල් dBA 50ට අඩු විය යුතු අතර, රාත්‍රි කාලයේ දී එය dBA 45ට වඩා අඩු විය යුතු ය. | 25 |
| | 6. හෝටලයේ ගෙවතු අලංකරණ සැලසුමට ඉතා හොඳින් සකස් කරන ලද සහ විදුලි ආලෝකය සපයන ලද වාහන අංගනයක් ඇතුළත් විය යුතුය. | 25 |

## IV උපලේඛනය (සම්බන්ධිතයි)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව*<br>*ප්‍රදේශය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* | *III වැනි තීරුව*<br>*ලකුණු* |
|---|---|---|---|
| | | 7. හෝටල් සේවකයෙකු විසින් වාහනය රථ ගාල වෙත රැගෙන යාමේ පහසුකම් සහ රියදුරන් ධාවනය කරන වාහන සඳහා ඇමතුම් මගින් කැඳවීමේ ක්‍රමයක් තිබිය යුතු ය. | 25 |
| 2. | හෝටල් ගොඩනැගිල්ල | 1. ගොඩනැගිල්ලේ නිර්මාණය ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ සහ ඉදිකිරීම් ක්‍රමය මගින් සර්ම කලාපීය ප්‍රදේශයක ඇති සුඛෝපභෝගී හෝටලයක සුවිශේෂී ලක්ෂණ නිරූපණය විය යුතු ය. | 50 |
| | | 2. පරිසරයට සහ ස්ථානයට ගැළපෙන පරිදි ශ්‍රී ලාංකීය ගෘහ නිර්මාණ ශිල්පී ගති ලක්ෂණ පවත්වාගෙන යන බවට සහතිකවීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. | 25 |
| | | 3. හෝටලයේ ප්‍රධාන දොරටුව සුපිරි හෝටලයකට ඔබින පරිදි විය යුතු ය. | 25 |
| 3. | පොදු ප්‍රදේශ | 1. පිළිගැනීමේ ස්ථානය, හෝටලයේ සංකල්පයට අනුකූලව කවුන්ටරයක් සහිතව හෝ ඊට සමාන පහසුකමක් සහිතව එක්ව හෝ වෙන් වශයෙන් පිළිගැනීමේ අංශයකින්, අමුත්තන්ගේ සහායක සේවක අංශයකින් සහ මුදල් අයකැමි යන අයගෙන් සමන්විත විය යුතු ය. පිළිගැනීමේ අංශයේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටිය යුතු ය. අමුත්තන්ට සහාය වීම සහ ඔවුන්ගේ විමසීම්වලට පිළිතුරු දීම සඳහා පිළිගැනීමේ කාර්ය මණ්ඩලය මනා ලෙස පුහුණුකර තිබිය යුතු ය. විදේශ ව්‍යවහාර මුදල් පර්වර්තන අනුපාත පිළිගැනීමේ ස්ථානයේ ප්‍රකටම පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර තිබිය යුතු ය. අමුත්තන් පිට වී යාමේ දී ඔවුන්ට පහසුවන පරිදි බිල්පත් සකස් කිරීමේ කටයුතු ඉතා කඩිනමින් සහ කාර්යක්ෂමව සිදු කළ යුතු ය. | 50 |
| | | 2. පොදු ස්ථාන භාවිත කරන්නන්ට සැප පහසු ආකාරයට වායු සමනය කර හෝ වාතාශ්‍රය සපයා තිබිය යුතු අතර, කාමර භාවිත කරන්නන්ට සැප පහසු වන පරිදි එය වායු සමනය කර තිබිය යුතු ය. වායු සමනය කර ඇති ප්‍රදේශවල උෂ්ණත්වය ද ශරීරයට සුව පහසු මට්ටමකට වෙනස් කළ හැකි විය යුතු ය. (ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල), යම් මාසයක් සඳහා සාමාන්‍ය මාසික උෂ්ණත්වය සෙන්ට්‍රිගේට් $20^0$ වඩා අඩුවන හෝටල්වල කාමර උෂ්ණත්වය ශරීරයට සුව පහසු මට්ටමකට වෙනස් කළ හැකි උෂ්ණත්ව පාලක තාපක පද්ධතියක් පොදු ස්ථානවල තිබිය යුතු ය. | 50 |
| 4. | ආලින්දය | 1. හෝටලයේ පිහිටීම සහ පරිසරයට අදාළ ප්‍රතිරූපය සහ පෙනුම ආලින්දය හා අමුත්තන්ගේ ශාලාවේ (Lounge) පිළිඹිඹු විය යුතු ය. එය සුදුසු පරිදි සකස් කර වායු සමනය කර තිබිය යුතු අතර මධ්‍යම වායු සමන පහසුකම් හෝ වාතාශ්‍රය නිසි පරිදි සපයා තිබිය යුතු ය. තව ද, එම ස්ථානයේ හෝටලයේ ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රමාණවත් ආසන පහසුකම් තිබිය යුතු ය. හෝටලයේ ආලින්දයේ සහ අමුත්තන්ගේ ශාලාවේ (Lobby/Lunge) තබා ඇති ගෘහ භාණ්ඩ, සවි කිරීම්, අලංකාර ක්‍රම සහ සැරසිලි හොඳ තත්ත්වයෙන් තිබිය යුතු ය. එහි සපයා ඇති ආසන අවශ්‍ය පරිදි සකස් කළ හැකි, සුව පහසු සහ උසස් තත්ත්වයේ ඒවා විය යුතු ය. | 150 |
| | | 2. හෝටල් ලොබි ප්‍රදේශයට පැමිණෙන අයෙකුට විශේෂ ස්ථානයකට පැමිණි බවට හැඟීමක් ඇති විය යුතු අතර එම ප්‍රදේශය සුපිරි හෝටලයකට ගැළපෙන පරිදි විය යුතු ය. | 50 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව* *ප්‍රදේශය* | *II වැනි තීරුව* *පහසුකම්* | *III වැනි තීරුව* *ලකුණු* |
|---|---|---|---|
| | | 3. ආලින්දයේ/අමුත්තන්ගේ ශාලාවේ (Lobby/Lunge) ඍජු සහ ඍජු නොවන විදුලි ආලෝක සැපයුම් එකතුවක් තිබිය යුතු අතර එහි ප්‍රිය උපදවන සුළු ආලෝකයක් විය යුතු ය. කියවීම සහ ලිවීම වැනි ක්‍රියාකාරකම්වලට යෝග්‍ය ආකාරයේ ආලෝකයක් ආලින්දය ප්‍රදේශයේ තිබිය යුතු ය. | 25 |
| | | 4. මහජනතාව සඳහා ප්‍රමාණවත් පෞද්ගලිකත්වයක් සහිතව ආලින්දය ප්‍රදේශයේ ආවරණය කරන ලද දුරකථනයක් ඇතුළුව හෝටලයේ පොදු ස්ථානවල ප්‍රමාණවත් දුරකථන පහසුකම් තිබිය යුතු ය. | 25 |
| | | 5. ආගන්තුකයන්ගේ බරාද ප්‍රමාණවත් ලෙස පුළුල්ව, වාතාශ්‍රය සහිතව ආරක්ෂා සහිතව සහ ප්‍රමාණවත් පරිදි ආලෝකය සපයා තිබිය යුතු අතර එම බරාද හෝටලයේ ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය. | 25 |
| | ආගන්තුක සේවා | 6. සුපිරි හෝටලයකට සිටින ආගන්තුකයන් සඳහා පහත දැක්වෙන සේවා ලබාදිය යුතු ය. තැපැල් සේවාව, ඊමේල් සහ ෆැක්ස් පහසුකම්, බඩු බාහිරාදිය තාවකාලිකව ගබඩා කර තැබීමේ පහසුකම්, නැති වූ සහ හමු වූ භාණ්ඩ ලැයිස්තුගත කර ගබඩා කිරීමේ සේවාව, ප්‍රධාන පෙළේ ක්‍රෙඩිට් කාඩ්පත් භාරගැනීම, සංචාරක උපදෙස් සැපයීමේ අංශයක්, කුලී රථ සහ කුලියට මෝටර් රථ ලබා ගැනීමේ සේවාවක්, පොත්පත්, පුවත් පත්, තැපැල්පත්, මුද්දර, ලිපි ද්‍රව්‍ය, දුම්කොළ ඡායාරූප උපකරණ උපාංග, සිල්ලර භාණ්ඩ සහ වෛද්‍ය උපදෙස් රහිතව ගත හැකි ඖෂධ විකිණීමට කඩ සාප්පු. | 75 |
| 5. | නිදන කාමර | 1. තනි පුද්ගල නිදන ඇඳක ප්‍රමාණය අවම වශයෙන් මීටර් 1.07x2ක් විය යුතු අතර යුගල ඇඳක අවම ප්‍රමාණය මීටර් 1.82x2ක් විය යුතු ය. මෙට්ට සුව පහසු විය යුතු අතර සුපිරි හෝටලයක් සඳහා උචිත ඉතා උසස් තත්ත්වයේ ඒවා විය යුතු ය. මෙට්ටයක ඝනකම අවම වශයෙන් මී.මී. 150ක් වත් විය යුතු ය. | 60 |
| | | 2. සියලුම ආගන්තුක කාමරවල ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පරාසයක වූ ශාරීරික සුවතා ගෙන දෙන උෂ්ණත්වයක් පවත්වාගෙන යා යුතු ය. වායු සමනය කරන ලද නිදන කාමර සම්බන්ධයෙන් වන විට වෙනස් කළ හැකි වායු සමනය කරන ලද නිදන කාමර සම්බන්ධයෙන් වන විට වෙනස් කළ හැකි වායු සංසරන පද්ධතියක් පැවතිය යුතු අතර සෙන්ටිග්‍රේට් 24 සිට + 4 දක්වා පරාසයක උෂ්ණත්ව වෙනස් කළ හැකි උෂ්ණත්ව පාලක තිබිය යුතු ය. ප්‍රමාණවත් අන්දමින් පිරිසිදු වාතාශ්‍රය කාමරය තුළට ලබා ගැනීම සඳහා පහසුකම් තිබිය යුතු ය. සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 20ට වඩා අඩු වන යම් මාසයක හෝටල්වල කාමර උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 24 දක්වා වෙනස් කළ හැකි උෂ්ණත්ව පාලක තාපක පද්ධතියක් මගින් පාලනය වන උණුසුම් කිරීමේ ක්‍රමයක් හෝටල් කාමරවල තිබිය යුතු ය. (ASHRAE මාර්ගෝපදේශ බලන්න.) | 50 |

## IV උපලේඛනය (සම්බන්ධිතයි)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව*<br>*ප්‍රදේශය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* | *III වැනි තීරුව*<br>*ලකුණු* |
|---|---|---|---|
| | | 3. සුපිරි හෝටලයක් සඳහා සුදුසු වන පරිදි පහත දැක්වෙන අයිතම තිබිය යුතු ය.<br>(1) ඇඳි පුටු 2ක් සහ කුඩා මේසයක් ;<br>(2) කණ්ණාඩි මේසයක් හා පුටුවක් හෝ ස්ටූල් එකක් ;<br>(3) ලියන මේසයක් හා පුටුවක් ;<br>(4) ජාත්‍යන්තර වැඩ සටහන් නැරඹිය හැකි රූපවාහිනියක් වීසීඩී. ඩීවීඩී. සහ සීඩී ප්ලේයර් ;<br>(5) ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ සංගීතය සැපයීමේ උපකරණ (රූපවාහිනි යන්ත්‍රයකට සම්බන්ධිත නම් වඩාත් යෝග්‍යය) ;<br>(6) සෘජු ජාත්‍යන්තර ඇමතුම් පහසුකම් සහිත කාමරය තුළ සවිකළ දුරකථනයක් ;<br>(7) සේවා ඇමතුම් අංක නාමාවලියක්, කාමර සේවා කෑම වට්ටෝරුපත සහ (මිනිබාර්) කාමරය තුළ ඇති කුඩා ශීතකරණයේ ඇති පාන වර්ග සඳහා අයකරන ගාස්තු ;<br>(8) ලිපි ද්‍රව්‍ය දේශීය හා විදේශීය තැපැල් ලියුම් කවර ;<br>(9) ප්‍රමාණවත් රැක් සහ හැගර් සහිත ඇඳුම් අල්මාරි හෝ බිත්ති අල්මාරි ;<br>(10) පරිගණක සහ වෙනත් තොරතුරු තාක්ෂණ උපකරණ සම්බන්ධ කිරීමේ පහසුකම් ;<br>(11) බීම වර්ග පුරවා ඇති මිනිබාර් එකක් සහ වීදුරු ප්‍රමාණවත් සංඛ්‍යාවක් ;<br>(12) ඉල්ලා සිටිනු ලැබුවහොත් තොටිල්ලක් ;<br>(13) මදුරුවන්ට එරෙහි ආරක්ෂාව හෝ මදුරු දැල්. | 125 |
| | | 4. බීම සහ සිවිලිම ඉතා උසස් තත්ත්වයේ නිමාවකින් සමන්විත විය යුතු ය. | 75 |
| | | 5. සෑම නිදන කාමරයකම පහත දැක්වෙන විදුලි ආලෝක ක්‍රම තිබිය යුතු ය. (1) ඇතුළුවීමේ දොර ආසන්නයේ සවි කර ඇති ප්‍රධාන ස්විච් එක මගින් පාලනය කරනු ලබන සමස්ත කාමරය ආලෝකමත් කිරීම. (2) සියලුම විදුලි පහන් පුද්ගලයක් විසින් ක්‍රියාත්මක කිරීමට අමතරව ඇඳ ආසන්නයේ සිට ක්‍රියාත්මක කිරීමේ පහසුකම ද තිබිය යුතු ය. (3) ඇඳි පුටුවේ සිට සහ ඇඳෙහි සිට කියවීම සඳහා හොඳ තත්ත්වයේ සහ ප්‍රමාණවත් ආලෝකය සහිත අවශ්‍යතාව අනුව සකස් කර ගත හැකි විදුලි පහන් තිබිය යුතු ය. (4) කණ්ණාඩිය ඉහළින් විදුලි පහන් තිබිය යුතු ය. (5) ඇඳුම් අල්මාරිවල දොර විවෘත කරන විට විදුලි පහන් දැල්වෙන ක්‍රමයක් තිබිය යුතු ය. නිදන කාමරයේ භාවිත කරන විදුලි ආලෝකයේ මට්ටම පවත්වාගෙන යාම සඳහා නිර්දේශ කර ඇත්තේ මෙසේ ය. නිදන කාමරයේ සාමාන්‍ය ආලෝකය Lux 75 කියවීම සඳහා (ඇඳ අසල සහ ඇඳ පුටුවේ) Lux 300, කණ්ණාඩිය අසල තිබිය යුතු ආලෝකය Lux 300 | 125 |

## IV උපලේඛනය (සම්බන්ධිතයි)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව ප්‍රදේශය* | *II වැනි තීරුව පහසුකම්* | *III වැනි තීරුව ලකුණු* |
|---|---|---|---|
| | | 6. දොරෙන් පිටත බැලීමේ හිලක් සහ ආරක්ෂක අසව්වක් | 30 |
| | | 7 ඉහළ කපු ප්‍රතිශතයක් සහිත ඉතා උසස් තත්ත්වයේ ඇඳ ඇතිරිලි, පොරෝනා සහ මෙට්ට කවර ප්‍රමාණවත් සැපයුමක් | 50 |
| | | 8. ඉතා උසස් තත්ත්වයේ කොට්ට පාවිච්චිය සඳහා තිබිය යුතු ය. | 25 |
| | | 9. ඉල්ලා සිටින විට ශරීරයට අහිතකර නොවන කොට්ට ඇතුළු කොට්ට තෝරා ගැනීමේ ක්‍රමයක් තිබිය යුතු ය. | 25 |
| | | 10. ඉතා උසස් තත්ත්වයේ සහ ජලය අවශෝෂණය කරන ස්නානය කිරීමේ දී, මුහුණ පිස දැමීමේ දී සහ අත්පිස දැමීමේ දී භාවිතා කරන තුවා (සුදු පැහැති) ප්‍රමාණවත් සැපයුමක් තිබිය යුතු අතර පා පිස්නා ද තිබිය යුතු ය. ඇඳ ඇතිරිලි සහ තුවා දිනපතා හෝ ආගන්තුකයා විසින් ඉල්ලා සිටින පරිදි වෙනක් කළ යුතු ය. ස්නානය සඳහා පාවිච්චි කරන ලබන ලෝගු සහ සෙරෙප්පු උසස් තත්වයෙන් තිබිය යුතු ය. | 50 |
| | | 11. මිනිසකුගේ උසට සමාන ප්‍රමාණයේ කණ්ණාඩියක් | 20 |
| 6. | නාන කාමර | 1. නාන කාමරවල ඉතා උසස් තත්ත්වයේ නොලිස්සර බිමක්, බිත්ති සහ සිවිලිමක් තිබිය යුතු ය. | 15 |
| | | 2. නාන කාමර උපාංග සහ සවිකිරීම් ඉතා උසස් තත්ත්වයෙන් පැවතිය යුතු ය. | 25 |
| | | 3. සුපිරි හෝටලයක පහත දැක්වෙන අයිතමයන් තිබිය යුතු ය. (1) විශාල කවුන්ටරයක් සහිත සහ/හෝ තට්ටු සහිත ප්‍රමාණවත් අවකාශයක් ඇති මුහුණ සේදීමේ බේසමක් (2) ජල මුද්‍රිත වැසිකිළියක් (3) නොලිස්සන මතු පිටක් හෝ නොලිස්සන උපකරණයක් ද ආධාරකයක් (ග්‍රැබ් බාර්) සහ අතින් ක්‍රියාත්මක කරන වතුර මලක් සහිත අවම දිග සෙ.මී. 160ක් වත් (4) ප්‍රමාණවත් ජල පීඩනයක් සහිත හොඳින් සවිකර ඇති වතුර මලක් (5) හැන් බීඩ්, කොණ්ඩ වේලීමේ උපකරණයක් විදුලි ආලෝකය සහිත "ලොකු කර බැලීමේ කණ්ණාඩියක්,යුනිවර්සල් ෂේවර් සොකට්, වැසිකිළි කඩදාසි රඳවනයක්, තුවා රඳවනයක් සහ ආවරණය කරන ලද සනීපාරක්ෂක කසළ බඳුනක් (6) දුරකථනය (7) ප්‍රමාණවත් ටිෂූ කඩදාසි (8) සබන්, ෂැම්පූ, කන්ඩිෂනර්, ජෙල්, බොඩි ලෝෂන්, රැවුල කැපීමේ උපකරණ. ෂවර් කැපු, සපත්තු පොලිෂ් සහ ඇකිලිය හැකි ඇඳුම් වැලක් ඇතුළත් වන නාන කාමර උපරකණ | 25 |
| | | 4. නාන කාමරවල ස්නානය සඳහා වෙන් කර ඇති කුටිවල ප්‍රමාණය වර්ග මීටර් 1.14කට වඩා අඩු නොවිය යුතු අතර කුඩා ප්‍රමාණයේ කාමරයක ප්‍රමාණය වර්ග මීටර් 1.0 වඩා අඩු නොවිය යුතු ය. එම කුඩා කුටීර ආවරණය කරන ලද හෝ ලැමිනේට් කරන ලද වීදුරුවලින් සාදා තිබිය යුතු බවට නිර්දේශ කරනු ලැබිය යුතු ය. එහි බිම ලිස්සන සුළු නොවිය යුතු ය. එහි ඇතුළත ආධාරක (ග්‍රැබ් බාර්ස්) තිබිය යුතු ය. | 25 |
| | | 5. සියලු නාන කාමරවල ජලය සුරකින ආකාරයේ සවිකිරීමේ සහ උපරකණ තිබිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ. | 25 |
| | | 6. දිය නෑම, ෂවර් සහ මුහුණ සේදීමේ බේසම් පිහිටා ඇති ස්ථානවල උණු දිය සහ සිසිල් දිය මිශ්‍ර කිරීමේ පහසුකම් තිබිය යුතු ය. | 25 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව ප්‍රදේශය* | *II වැනි තීරුව පහසුකම්* | *III වැනි තීරුව ලකුණු* |
|---|---|---|---|
| | | 7. නාන කාමරවල යහපත් මට්ටමේ ආලෝක තත්ත්වයක් තිබිය යුතු අතර කණ්ණාඩි මුහුනතට හොඳින් ආලෝකය වැටෙන පරිදි සකසා තිබිය යුතු ය. ආලෝක මට්ටම පහත දැක්වෙන පරිදි විය යුතු ය. නාන කාමරය (සාමාන්‍ය ආලෝකය Lux 120) (කණ්ණාඩිය) මුහුණත අසල ආලෝකය ලැබීම Lux 300 විදුලි ස්විචය නාන කාමරයෙන් පිටත සවිකර තිබිය යුතු ය. | 25 |
| 7. | ගෘහ පාලනය | 1. හෝටලයේ සියලුම රෙදි සහ අමුත්තන්ගේ රෙදි පිරිසිදු කළ හැකි ඩ්‍රයික්ලීන් පහසුකම් සහිත යාන්ත්‍රික ලොන්ඩරියක් හෝ පිටස්තර පුද්ගලයන් ලවා එම කටයුතු කර ගැනීමෙ පහසුකමක් තිබිය යුතු ය. | 25 |
| | | 2. අලුත් රෙදි සහ භාවිත කරනු ලබන රෙදි සඳහා ප්‍රමාණවත් ගබඩා කිරීමේ පහසුකම් සහිතව හොඳින් වාතාශ්‍රය සහිත රෙදි ගබඩා කිරීමේ කාමරයක් තිබීම. | 15 |
| 8. | ආපන ශාලාව සහ බාර් | 1. පැය 24 ක්‍රියාත්මක වන අවන්හලක් පැවතීම | 50 |
| | | 2. පැය 24 පුරාම කාමර තුළ ආහාර සැපයීමේ පහසුකම් තිබිය යුතු ය. | 25 |
| | | 3. ආපනශාලාවල ඇති බිත්ති, ගෙබිම, සිවිලිම, දොරවල්, ජනෙල්, ලී කැටයම් සහ සවිකිරීම් යහපත් තත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. | 50 |
| | | 4. ගෘහ භාණ්ඩ සැප පහසු, භාවිත කළ හැකි තත්ත්වයේ සහ ඉතා උසස් තත්ත්වයෙන් නිමවා තිබිය යුතු අතර, ඒවා යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. | 25 |
| | | 5. ගෘහ භාණ්ඩ තබා ඇති ආකාරය සහ අලංකාර කිරීමේ ක්‍රම මගින් හෝටලයේ සහ/හෝ ආපනශාලාවේ තේමාව ප්‍රවර්ධනය විය යුතු ය. | 25 |
| | | 6. භෝජනාගාරවල බිම්වල නිමාව උසස් තත්ත්වයෙන් තිබිය යුතු අතර, එය උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. | 25 |
| | | 7. අත්පිස්නා, ජලය අවශෝෂණය කිරීමේ රෙදිවලින් නිමවා තිබිය යුතු අතර. එහි අවම ප්‍රමාණය සෙ.මී. 48 x 48 විය යුතු ය. | 25 |
| | | 8. ඉතා උසස් තත්ත්වයේ පිඟන් කෝප්ප, වීදුරු සහ වෙනත් මේස උපකරණ සහ මේස රෙදි ප්‍රමාණවත් ප්‍රමාණයක් තිබිය යුතු ය. | 50 |
| | | 9. කඩිනම් සහ කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා කාර්ය මණ්ඩලය විසින් නිෂ්පාදන දැනුම හා සේවා නිපුනතා පිළිබඳ උසස් මට්ටමක් ප්‍රදර්ශනය කළ යුතු ය. | 50 |
| | | 10. ආහාර නිසි උෂ්ණත්වයක් සහිතව ලබා දිය යුතු ය. ආහාර සහ බීම වර්ග ප්‍රදර්ශනයට තබා ඇති ස්ථානවල නිසි උෂ්ණත්වයක් පවත්වාගෙන යා යුතු ය. | 25 |
| | | 11. වට්ටෝරුපත සහ පානවර්ග/වයින් ලැයිස්තුව ඉදිරිපත් කිරීම, ක්‍රමය සහ සුවපහසුව පිළිබඳ විස්තර සඳහා වැඩි අවධානයක් යොමු කරන ලද බව පිළිඹිබු වන ආකාරයට කළ යුතු ය. | 25 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව ප්‍රදේශය* | *II වැනි තීරුව පහසුකම්* | *III වැනි තීරුව ලකුණු* |
|---|---|---|---|
| | | 12. විශේෂ ආහාර වර්ග සහිත ආපනශාලා | 25 |
| | | 13. හෝටලයේ අමුත්තන් පමණක් භාවිත කරන බාර් එක | 25 |
| | | 14. සේවා සැපයීම/පාන වර්ග කළවම් කිරීම සඳහා වෙන් වූ බාර් තිබිය යුතු ය. | 25 |
| | | 15. බාර් එක/බාර්වල උපකරණ සහ ගෘහ භාණ්ඩ හොඳින් තිබිය යුතු අතර ඉහත උසස් තත්ත්වයේ කවුන්ටර්, මේස, පුටු සහ සවිකිරීම් තිබිය යුතු ය. ආලෝකය, මඳ ආලෝකයක් විය යුතු ය. කවුන්ටරය පිටුපස වැඩ කිරීම සඳහා ප්‍රමාණවත් ආලෝකය සපයා තිබිය යුතු ය. | 25 |
| | | 16. බාර් එක ඇතුළත අයිස් කැට සෑදීමේ යන්ත්‍රයක් නොමැති නම් අයිස් කැට ගබඩා කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත පහසුකම් තිබිය යුතු ය. | 25 |
| | | 17. වයින් වර්ග, ස්ප්‍රිට් වර්ග සහ වෙනත් බීම වර්ග පිළිගැන්වීම සඳහා අවශ්‍ය සියලු වර්ගවල වීදුරු බාර් එකේ/බාර්වල තිබිය යුතු ය. | 50 |
| | | 18. විවිධ වර්ගවල දේශීය හා විදේශීය වයින් වර්ග ස්ප්‍රිට් වර්ග සහ බීම වර්ග විශාල ප්‍රමාණයක් තිබිය යුතු ය. | 50 |
| | | 19. ආහාර ගැනීමේ ස්ථානවල/බාර් ප්‍රදේශයේ සිහින් ස්වරයෙන් වූ පසුබිම් සංගීතයක් තිබිය යුතු ය. | 25 |
| 9 | මුළුතැන්ගෙය | 1. ප්‍රධාන මුළුතැන්ගෙය/සැටලයිට් මුළුතැන්ගෙය ආහාර ගැනීමේ ස්ථානවලට යෝග්‍ය පරිදි ආසන්නව පිහිටා තිබිය යුතු ය. | 50 |
| | | 2. මුළුතැන්ගෙය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වන බව සහතික වීම පිණිස වෘත්තීමය ලෙස සහ අවශ්‍ය සියලු උපකරණවලින් යුතු ව තිබිය යුතු ය. විවිධ ක්‍රියා සිදු කරන ස්ථාන වෙන් කර තිබිය යුතු ය. | 50 |
| | | 3. ගෙබිම, සීලිම, දොරවල්, ජනෙල් මට්ටම් සහ ලීවලින් සාදන ලද උපකරණ ඉතා පිරිසිදු හා හොඳ තත්ත්වයෙන් තිබිය යුතු ය. මුළුතැන්ගෙයි සියලු බිත්ති ඉතා පහසුවෙන් පිරිසිදු කළ හැකි විය යුතු අතර බිම සිට සෙන්ටිමීටර් 150 උසින් ජලය අවශෝෂණය නොවන පරිදි සාදා තිබිය යුතු ය. | 25 |
| | | 4. ආලෝකය ප්‍රමාණවත් දීප්තියකින් සමන්විත විය යුතු ය. විදුලි පහන් නොබිඳෙන සහ ඉතා පහසුවෙන් පිරිසිදු කළ හැකි ආවරණවලින් යුතු විය යුතු ය. | 25 |
| | | 5. මුළුතැන්ගෙයි මේස මතුපිට සහ රාක්ක මල නොබැඳෙන වානේ හෝ ලෝහයම නොවන සහ ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතු අතර මේස හා රාක්ක හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. | 25 |
| | | 6. මුළුතැන්ගෙයි උපකරණ ඉතා ඉහළ ගුණාත්මක බවකින් යුක්ත විය යුතු අතර ඒවා පිරිසිදු හා ප්‍රමාණවත් විය යුතු ය. | 50 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව*<br>*ප්‍රදේශය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* | *III වැනි තීරුව*<br>*ලකුණු* |
|---|---|---|---|
| | | 7. ජාත්‍යන්තර ආහාර සකස් කිරීම සඳහා අවශ්‍ය උපකරණ රාශියකින් මුළුතැන්ගෙය සමන්විත විය යුතු ය. | 50 |
| | | 8. පිසින ලද සහ අමු ආහාර සියලු අවස්ථාවන්හි දී ආවරණය කර සුරක්ෂිතව තැබිය යුතු ය. | 50 |
| | | 9. උෂ්ණත්වය අවශ්‍ය පරිදි පාලනය කළ හැකි උණුසුම් හා සිසිල් ආහාර තබා ගැනීමේ උපකරණ ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතු ය. | 75 |
| | | 10. මුළුතැන්ගෙය කෘමීන්ගෙන් හා මීයන්ගෙන් තොර විය යුතු ය. මුළුතැන්ගේ ජනෙල්වලට අවශ්‍ය පරිදි මැස්සන් පැමිණීම වැළැක්වීමේ තිර ආවරණ යොදා තිබිය යුතු ය. ක්‍රමෝපාය ස්ථානවල කෘමිනාශක විදුලි උපකරණ තිබිය යුතු ය. | 25 |
| | | 11. මුළුතැන්ගේ ඇතුළත ආහාර ගබඩා කිරීම සඳහා වූ සියලු කබඩ්වල මල නොබැඳෙන වානේවලින් හෝ ලෝහමය නොවන සහ ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතු ය. | 50 |
| | | 12. ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් හා මළ නොබැඳෙන වානේ වලින් සාදන ලද රාක්ක තිබිය යුතු ය. | 25 |
| | | 13. හැඳි ගැරුප්පු, පිඟන් භාණ්ඩ සහ වීදුරු බඩු ගබඩා කිරීම සඳහා මළ නොබැඳෙන වානේ හෝ වෙනත් සුදුසු ද්‍රව්‍යයකින් සාදන ලද රාක්ක ප්‍රමාණවත් ලෙස තිබිය යුතු ය. | 25 |
| | | 14. ආහාර පිළියෙළ කිරීමේ දී, ප්‍රදර්ශනය කිරීමේ දී සහ පිළිගැන්වීමේ දී ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලවන ඉතා ඉහළ තත්ත්වයෙන් පිරිසිදුකමක් සහ සනීපාරක්ෂාවක් පවත්වාගෙන යා යුතු ය. | 50 |
| | | 15. මුළුතැන්ගෙය අවට ඇති සියලු කාණු වසා තැබිය යුතු අතර, ඒවා වසන තද පයිප්ප පද්ධතියක් හා සම්බන්ධ කර තිබිය යුතු ය. එම පයිප්ප තෙල් වෙන් කිරීමේ උපකරණයකට සවිකර තිබිය යුතු ය. අපද්‍රව්‍ය රැගෙන යන පයිප්ප ජාලය සඳහා ප්‍රමාණවත් හා නිසි පරිදි පිරිසිදු කිරීමේ පහසුකම් තිබිය යුතු ය. මුළුතැන්ගෙය ඇතුළත විවෘත කාණු නොතිබිය යුතු ය. | 75 |
| | | 16. මුළුතැන්ගෙයි සියලුම බේසම් ( Sink) වල උසස් තත්ත්වයේ සහ පිරිසිදු කළ හැකි පෙරන තිබිය යුතු ය. | 25 |
| | | 17. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල වන පරිදි ප්‍රමාණවත් ශීතකාමර ඇතුළත ගමන් කළ හැකි (Walk in) සහ අත පෙවිය හැකි (Reach in) වර්ගවල අධිශීතකරණ සහ හිමකරණ පහසුකම් තිබිය යුතු ය. | 50 |
| | | 18. පාදයෙන් ක්‍රියාත්මක කරන කාර්මික වර්ගයේ සහ ආවරණ සහිත කසළ බඳුන් සෑහෙන ප්‍රමාණයක් තිබිය යුතු ය. එක් එක් වර්ගවල අපද්‍රව්‍ය බහාලීම සඳහා වෙන් වෙන් වූ කසළ බඳුන් තිබිය යුතු ය. | 50 |
| | | 19. මුළුතැන්ගේ එක් එක් ක්‍රියාකාරී ස්ථානවල උණු දිය සහ සිසිල් දිය සහිත අත් සේදීමේ ජල බේසම් තිබිය යුතු අතර සබන්, එක් වරක් භාවිතා කර බැහැර කළ හැකි තුවා හෝ අත් වේලන උපකරණ තිබිය යුතු ය. | 50 |

## IV උපලේඛනය (සම්බන්ධිතයි)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව*<br>*ප්‍රදේශය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* | *III වැනි තීරුව*<br>*ලකුණු* |
|---|---|---|---|
| 10. | සනීපාරක්ෂක නියම | 1. සියලු සනීපාරක්ෂක සවිකිරීම්වල තත්ත්වය ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව ඉතා ඉහළ ප්‍රමිතියක් යුක්ත විය යුතු ය. හෝටල් ගොඩනැගිල්ල හා ඒ අවට සනීපාරක්ෂාව, පිරිසිදුකම සහ සෞඛ්‍ය පාලනය කරමින් දැඩි ප්‍රමිති පනවා තිබිය යුතු ය. | 50 |
| | | 2. මුළුතැන්ගේ අපද්‍රව්‍යවලින් මේද වෙන් කිරීමේ කාර්ය සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබිය යුතු ය. වෙන් කරන ලද මුළුතැන්ගේ අපද්‍රව්‍ය ජලය, මලාපවාහන සහ රෙදි සේදූ අපද්‍රව්‍ය ජලය සම්බන්ධයෙන් පාරිසරික නියෝගවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය. | 25 |
| | | 3. පහසුවෙන් පිරිසිදු කිරීම සඳහා සහ උසස් සෞඛ්‍ය තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා බැහැර කරන අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා වෙන් වූ සහ සුදුසු මතුපිට නිමාවකින් යුතු සහ ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් තිබිය යුතු ය. උසස් තත්ත්වයේ සනීපාරක්ෂක ප්‍රමිති පවත්වාගෙන යාම සඳහා මාළු, මස්, පළතුරු සහ එළවළු පිරිසිදු කිරීම සඳහා ඉඩ පහසුකම් තිබිය යුතු ය. | 25 |
| | | 4. ගොඩනැගිල්ල පුරා සහ ඒ අවට තදාසන්න ප්‍රදේශය කෘමීන්ගෙන් සහ පණුවන්ගෙන් තොර කිරීමට සාර්ථක වැඩ පිළිවෙළක් තිබිය යුතු ය. පරිසරය පිරිසිදුව තබා ගැනීමට හැකි සෑම පියවරක්ම ගත යුතු අතර මැස්සන් හා මදුරුවන් බෝවීම වැළැක්විය යුතු ය. | 25 |
| | | 5. භාවිත කරනු ලබන විෂ බීජ නාශක සහ රසායනික ද්‍රව්‍ය ජෛව බිඳ වැටීමක් (ක්ෂුද්‍ර වියෝජනයක්) වන ස්වභාවයේ ඒවා විය යුතු ය. | 25 |
| 11. | ආරක්ෂාව සහ සුරක්ෂිත බව | 1. හෝටලය නිර්මාණය කිරීමේ දී ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආරක්ෂණ ප්‍රමිති පිළිපැදිය යුතු ය. | 50 |
| | | 2. අමුත්තන්ගේ සහ ඔවුන්ට අයත් බඩු බාහිරාදියේ ආරක්ෂාව හා සුරක්ෂිත බව පිළිබඳව හෝටලය සහතික විය යුතු ය. ඉහත කී අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය සුපරික්ෂාකාරී පියවර ගත යුතු ය. | 25 |
| | | 3. සියලු ගෑස් සහ විදුලි උපකරණ සවි කිරීම් ආරක්ෂා සහිත විය යුතු අතර ආරක්ෂිත නියෝගවලට අනුකූල විය යුතු ය | 25 |
| | | 4. යම් හදිසි අවස්ථාවක දී භාවිත කිරීම සඳහා රෝද පුටු සහ ගිලන් මැස්සවල් තිබිය යුතු ය. | 25 |
| 12. | විනෝදවීමේ, පහසුකම් ක්‍රීඩා පහසුකම් සහ වෙනත් පහසුකම් | 1. සම්ප්‍රදායික ශ්‍රී ලාංකික සංස්කෘතික, නැටුම් හා සංගීතය කෙරෙහි ප්‍රබල ලෙස අවධානයට යොමු කරමින් හෝටලය විසින් අමුත්තන් සඳහා විනෝදාස්වාදය සැපයිය යුතු ය. | 25 |
| | | 2. හෝටලයේ සංකල්පයට/අරමුණුවලට අනුකූලව විනෝදස්වාදය හා ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු ය. ක්‍රියාකාරකම් සහ පහසුකම් පහත දැක්වෙන දේවලින් තෝරාගත හැකි ය :-<br><br>සජීවීකරන වැඩසටහන්, ස්වායු ව්‍යායාම, යෝග, අසුන් පිටයාම, භාවනා කිරීම, පක්ෂීන් නැරඹීම, ස්වාභාවික සෞන්දර්ය ස්ථාන නැරඹීමට යාම, ජල ක්‍රීඩා, | 50 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව* *ප්‍රදේශය* | | *II වැනි තීරුව* *පහසුකම්* | *III වැනි තීරුව* *ලකුණු* |
|---|---|---|---|---|
| | | | ටෙනිස්, ස්කොශ් ක්‍රීඩාව, දැල්පන්දු, මේස පන්දු, ළමුන් සඳහා වූ ක්‍රීඩා, බිලියර්ඩ්, ස්නූකර්, ස්පා, සම්භාහනය, ආයුර්වේද/වෛද්‍ය ස්පා, ජාකුසි, ශාරීරික අභ්‍යාස පුහුණු මධ්‍යස්ථාන, කුළියට ලබා ගත හැකි බයිසිකල්, පුස්තකාලය, රාත්‍රී සමාජශාලා/ඩිස්කෝ මෙම ලැයිස්තුවේ ඇති අංගවලින් 50 වඩා ලබා දෙන්නේ නම්, එය සම්පූර්ණ ලකුණු ලැබීමට සුදුසුකමක් වන්නේ ය. | |
| | | 3. | නවීන උපකරණ හා පහසුකම් සහිත යෝග්‍ය පරිදි නිර්මාණය කරන ලද සුව පහසු සම්මන්ත්‍රණ ශාලාවක් තිබිය යුතු ය. | 50 |
| | | 4. | උත්සව ශාලාවලට වෙන වශයෙන් වූ පිවිසුම් දොරටු තිබිය යුතු අතර ඒවාට පමණක් වෙන් වූ ප්‍රමාණවත් සාමාන්‍ය වැසිකිළි තිබිය යුතු ය. උත්සව ශාලාවල පහසුකම් හෝටලයේ ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය. | 75 |
| | | 5. | උත්සව ශාලා සඳහා ඊට යාබදව වෙනම මුළුතැන්ගෙයක් ද සේදීමේ සහ ගබඩා කිරීමේ පහසුකම් ද තිබිය යුතු ය. | 75 |
| | | 6. | අමුත්තන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය සියලු උපකරණවලින් මනාව සමන්විත සහ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ඇති ව්‍යාපාරික මධ්‍යස්ථානයක් තිබිය යුතු ය. | 50 |
| 13. | පිහිනුම් තටාක | 1. | හෝටලයේ ප්‍රමාණයට සමානුපාතික වන පරිදි සාධාරණ විශාලත්වයකින් යුත් පිහිනුම් තටාකයක් තිබිය යුතු ය. එම පිහිනුම් තටාකයේ සංකල්පය, නිර්මාණය සහා ඉදිකිරීම ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආරක්ෂක ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය. තටාකය භාවිතා කරන්නන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන පරිද්දෙන් තටාකය තුළට ඉදිකිරීම නොකළ යුතු ය. පහසුවෙන් දැකිය හැකි සහ ප්‍රවේශ විය හැකි ස්ථානවල ආරක්ෂක උපකරණ ප්‍රමාණවත් තරම් තිබිය යුතු ය. | 50 |
| | | 2. | පිහිනුම් තටාකය විවෘතව තැබෙන අවස්ථාවල නිසි පරිදි පුහුණුවලත් ජීවිත ආරක්ෂකයන් ඒ අසල සිටිය යුතු ය. | 25 |
| | | 3. | පිහිනුම් තටාක ආසන්නයේ වතුර මල් (Shower) සෑහෙන ප්‍රමාණයක් තිබිය යුතු ය. උණුසුම් හා සිසිල් ජලය වැහෙන වතුර මල්වලින් යුතු ආවරණය කරන ලද කුටි වලින් සමන්විත වූ ඇඳුම් මාරු කිරීමේ කාමර පිරිමින් හා කාන්තාවන් සඳහා වෙන් වෙන්ව සාදා තිබිය යුතු ය. කුඩා කබඩ් සෑහෙන ප්‍රමාණයක් ද තිබිය යුතු ය. | 25 |
| | | 4. | පිහිනුම් තටාකය ප්‍රමාණවත් පරිදි ආලෝකමත් කර තිබිය යුතු ය. | 25 |
| | | 5. | ඉතා උසස් තත්ත්වයේ පිහිනුම් තටාක ගෘහ භාණ්ඩ සෑහෙන ප්‍රමාණයක් තිබිය යුතු ය. | 25 |
| | | 6. | ආහාර සහ පාන වර්ග සැපයීමේ සේවාවක් පිහිනුම් තටාකය අසල පැවතිය යුතු ය. පිහිනුම් තටාකය අසල දී ආහාර පාන පිළිගැන්වීමේ දී ඉතා උසස් තත්ත්වයේ නොබිඳෙන සුළු වීදුරු භාණ්ඩ භාවිත කළ යුතු ය. | 25 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව ප්‍රදේශය* | *II වැනි තීරුව පහසුකම්* | *III වැනි තීරුව ලකුණු* |
|---|---|---|---|
| 14. | ආබාධිත අමුත්තන් සඳහා | 1. ආබාධිත අමුත්තන් සඳහා අවම වශයෙන් ප්‍රමාණවත් පහසුකම් සහිත අමුත්තන්ගේ කාමර 01 වත් වෙන් කර තිබිය යුතු අතර එය බිම් මහලේ පැවතීම වඩා යෝග්‍ය වේ. | 50 |
| 15. | පොදු වැසිකිළි | 1. හෝටලයේ ප්‍රමාණය සහ කාර්ය කටයුතුවලට අනුකූලව කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන් වශයෙන් වූ ප්‍රමාණවත් වැසිකිළි සංඛ්‍යාවක් තිබිය යුතු අතර, ඒවා පහසුවෙන් සොයාගත හැකි සේ පිහිටා තිබිය යුතු ය. | 25 |
| | | 2. සවි කිරීම් සහ උපකරණවලට කොමඩ් (Comde) හැන්ඩ් බිඩේ (අතින් ක්‍රියාකරවන දෝවනය), ටොයිලට් පේපර් රඳවනය, උණු සහ සිසිල් ජලය මිශ්‍රණ කරාමයක් සහිත සේදීමේ බේසමක්, ආලේපන යනාදිය තබාගැනීමට කවුන්ටරයක්, කන්නාඩි, සබන් හෝ සබන් දියර අඩංගු උපකරණ, වරක් භාවිත කර ඉවතලන තුවා හෝ උණුසුම් ඇති වියළන යන්ත්‍ර, ආවරණ කරන ලද සනීපාරක්ෂණ අපද්‍රව්‍ය කසල බඳුන්, භාජන සහ සනීපාරක්ෂක බෑග්, කසල බඳුන් ආදිය ඇතුළත් වේ. | 25 |
| | | 3. වැසිකිළියට ප්‍රමාණවත් වාතාශ්‍රය ලැබිය යුතු ය. | 25 |
| 16. | කාර්ය මණ්ඩලය | 1. සාමාන්‍යාධිකාරීවරයාට, පිළිගත් හෝටල් පාසැලකින්/ ආයතනයකින් ආගන්තුක සත්කාර/ආහාරපාන සම්පාදන කළමණාකරනය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් තිබිය යුතු ය. | 25 |
| | | 2. සියලු අංශ ප්‍රධානීන් වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලැබූ පළපුරුදු අයවිය යුතුය. | 25 |
| | | 3. විධායකයන්/කළමනාකරණ කාර්ය මණ්ඩලය වෘත්තීමය සුදුසුකම් ලබා තිබිය යුතු ය. නැතහොත් පිළිගත් හෝටලයක අවම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්ද තිබිය යුතු ය. ස්ථිර කාර්ය මණ්ඩලයෙන් 75%කට ඔවුන්ගෙන් අදාළ ක්ෂේත්‍රවල යම් සහතිකයක් තිබිය යුතු ය. එම සහතික අදාළ අමාත්‍යාංශයේ තෘතීය හා වෘත්තීය පුහුණු දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබිය යුතු ය. | 50 |
| | | 4. හෝටලයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටිය යුතු ය. සියලු මෙහෙයුම්/ සේවා කාර්ය මණ්ඩලයට අමුත්තන්ට සතුටුදායක සේවයක් සැළසීම සඳහා සේවා සැපයීමේ දක්ෂතා පිළිබඳ උසස් තත්ත්වයක් තිබිය යුතු ය. ඔවුන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා නිතිපතා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සහ රැකියාව කරන අතරතුර පුහුණුව ලබා දිය යුතු ය. | 25 |
| | | 5. කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි සහ වෙනත් විදේශීය භාෂා පුහුණු කිරීමේ පන්ති පැවැත්වීමට හෝටලය කටයුතු කළ යුතු ය. | 50 |
| | | 6. සියලු කාර්ය මණ්ඩලය නිල ඇඳුමකින් සැරසිය යුතු ය. එම නිල ඇඳුම සාමාන්‍ය එකක් විය යුතු අතර එය හෝටලයේ තේමාවට අනුකූල විය යුතු ය. | 25 |

**IV උපලේඛනය (සම්බන්ධිතයි)**

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව ප්‍රදේශය* | *II වැනි තීරුව පහසුකම්* | *III වැනි තීරුව ලකුණු* |
|---|---|---|---|
| | | 7. කාර්ය මණ්ඩලය සඳහා නැවතීමේ පහසුකම් සළසා ඇතිවිට, එම ගොඩනැගිල්ලට ඉතා හොඳින් වාතාශ්‍රය තිබිය යුතු අතර එයට උපරිම වශයෙන් ස්වාභාවික ආලෝකය තිබිය යුතු ය. පිරිසිදු කිරීමේ පහසුව සඳහා ගෙබිම ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යවලින් නිමවා තිබිය යුතු ය. එක් අයෙකුට සපයා ඇති බිම් ප්‍රමාණය වර්ග මීටර් 5කට අඩු නොවිය යුතු ය. සැප පහසු ඇඳන් සහ සුදුසු මෙට්ට සැපයිය යුතු ය. බිත්ති සුමුදු විය යුතු අතර පිරිසිදු කිරීම පහසුවන පරිදි වූ නිමාවකින් යුක්ත විය යුතු ය. | 75 |
| | | 8. හෝටලයේ නැවතී නොසිටින කාර්ය මණ්ඩලය සඳහා එක් අයෙකුට වර්ග මීටර් 0.13ක ඉඩ ප්‍රමාණයක් සහිත ලාච්චු (ලොකර්) සැපයිය යුතු ය. එම ලාච්චුවල උස සෙන්ටිමීටර් 90 වඩා අඩු නොවිය යුතු අතර දිග සෙ.මී. 45 වඩා අඩු නොවිය යුතු ය. එම ලාච්චු 5 (ලොකර්) වලට හොඳින් වාතාශ්‍රය තිබිය යුතු ය. | 50 |
| | | 9. හෝටලයේ නැවතී සිටින කාර්ය මණ්ඩලය සඳහා එක් අයෙකුට වර්ග මීටර් 0.3ක ඉඩ ප්‍රමාණයක් සහිත ලාච්චු (ලොකර්) සැපයිය යුතු ය. එම ලාච්චුවල උස සෙ.මී. 90 වඩා නොවිය යුතු අතර දිග සෙ.මී. 45 වඩා අඩු නොවිය යුතු ය. එම ලාච්චුවලට හොඳින් වාතාශ්‍රය තිබිය යුතු ය. | |
| | | 10. කාර්ය මණ්ඩලයේ පහසුව තකා අගුළු කුටි සහිත කාමරවල/ පොදු නවාතැන් ශාලාවල ප්‍රමාණවත් සහ හොඳ තත්ත්වයේ සුව පහසු ගෘහ භාණ්ඩ තිබිය යුතු ය. | 10 |
| | | 11. හෝටලයේ නැවතී සිටින කාර්ය මණ්ඩලයේ ඇඳුම් සේදීම හා වියළීම සඳහා අමුත්තන්ට නොපෙනෙන ස්ථානයක් ලබා දිය යුතු ය. | 25 |
| | | 12. කාර්ය මණ්ඩලය සඳහා ආහාර ලබා දෙන විට සහ වෙන් වශයෙන් වශයෙන් පිළියෙළ කරනු ලබන විට, ප්‍රමාණවත් ලෙස උපකරණ සහිත පිරිසිදු කාර්ය මණ්ඩලය මුළුතැන් ගෙයක් තිබිය යුතු ය. මුළුතැන්ගෙයි උපකරණ සේදීම සඳහා උණු සහ සිසිල් ජලය මිශ්‍ර කර ලබා දීමේ පසහුකම් තිබිය යුතු ය. කාර්ය මණ්ඩලය මුළුතැන්ගෙය තුළ කෘමීන් සහ මීයන් නොසිටිය යුතු ය. | 75 |
| | | 13. කාර්ය මණ්ඩලය සඳහා සපයනු ලබන පහසුකම් නිසි පරිදි භාවත කරනු ලබන බවටත් ඒවා නිසි පරිදි නඩත්තු කරන බවටත් හෝටලය වග බලා ගත යුතු ය. | 50 |
| | | 14. කාර්ය මණ්ඩලය සඳහා ආහාර සපයනු ලබන විට කාර්ය මණ්ඩලය ආහාර ගැනීමේ ස්ථානය සඳහා මනා ලෙස වාතාශ්‍රය තිබිය යුතු ය. ගෙබිම, ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යවලින් නිමවා තිබිය යුතු ය. පිරිසිදු කිරීම පහසු කිරීම සඳහා බිත්තිවල බිම සිට සෙ.මී. 15ක් පමණ ඉහළට ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යවලින් සාදා තිබිය යුතු ය. එක් අයෙකුට අවම වශයෙන් වර්ග මීටර් 1.5ක් ලැබෙන පරිදි ආහාර ගැනීමේ ස්ථානය සාදා තිබිය යුතු ය. එකවර කාර්ය මණ්ඩලයෙන් 30%කට පමණ ආහාර ලබා දීම සඳහා ඉඩ ප්‍රමාණවත් විය යුතු ය. පහසුවෙන් පිරිසිදු කිරීමට හැකිවන පරිදි මේසය ජලය අවශෝෂණය නොකරන ද්‍රව්‍යවලින් ආවරණය කර තිබිය යුතු ය. | 75 |

IV උපලේඛනය (සම්බන්ධිතයි)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව*<br>*ප්‍රදේශය* | *II වැනි තීරුව*<br>*පහසුකම්* | *III වැනි තීරුව*<br>*ලකුණු* |
|---|---|---|---|
| | | පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු සහ වීදුරු සේදීම සඳහා උණු හා සිසිල් ජලය මිශ්‍ර කිරීමේ පහසුකම සහිතව අවම වශයෙන් සේදීමේ බේසම් (Wash Basin) දෙකක්වත් තිබිය යුතු ය. සබන් සහිතව අත්සෝදන ස්ථාන අත් වියළීමේ පහසුකම් තිබිය යුතු ය. | |
| | | 15. හෝටල් පරිසරය, පෞද්ගලික හැඩ ගැස්ම, සනීපාරක්ෂාව සහ පොදු පහසුකම් භාවිතය යන කරුණු පිළිබඳව දැන ගැනීමට නවක සේවා නියුක්තිකයන්ට පුහුණුවක් ලබා දිය යුතු ය. සියලුම කාර්ය මණ්ඩලය සඳහා ලිඛිත උපදෙස්, මාර්ගෝපදේශ සහ ආචාර ධර්ම පද්ධතියක් නිකුත් කළ යුතුය . | 25 |
| | | 16. හෝටලය මගින් කාර්ය මණ්ඩලය සඳහා නිතිපතා පුහුණුවක් ලබා දිය යුතු ය. නිසි පරිදි සුදුසුකම්ලත් පුහුණුකරුවන් විසින් පුහුණුව ලබා දිය යුතු අතර පුහුණුව පිළිබඳ වාර්තා පවත්වාගෙන යා යුතු ය. | 50 |
| | | 17. කාර්ය මණ්ඩලය සඳහා රූපවාහිනී නැරඹීමේ පහසුකම් ඇතුළු ප්‍රමාණවත් විනෝද ක්‍රීඩා පහසුකම් ලබා දිය යුතු ය. අවම වශයෙන් ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් ලබා දිය යුතු ය. පුවත්පත් හ ප්‍රමාණවත් සඟරා ආදිය සහිත පුස්තකාලයක් හෝ කියවීම් ශාලාවක් තිබිය යුතු ය. කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා වෙන් වශයෙන් වූ අභ්‍යන්තර පරිගණක කාමරයක් ලබා දිය යුතු ය. කාර්ය මණ්ඩලයේ පහසුව තකා කාර්ය මණ්ඩල සාප්පුවත් තිබිය යුතු ය. | 50 |
| | | 18. සුදුසුකම්ලත් පුහුණුකරුවකු යටතේ ක්‍රියාත්මක වන සම්පූර්ණ උපකරණ සහිත පුහුණුවීම් අංශයක් හෝටලය සතුව තිබිය යුතු ය. ප්‍රමාණවත් පහසුකම් සහිතව පුහුණුව සඳහා වෙන් වශයෙන් වූ කාමරයක් තිබිය යුතු ය. සෑම හෝටලයකට වෙන් වශයෙන් පුහුණුවීම් අත්පොතක් තිබිය යුතු අතර එම පොතට අනුව පුහුණුවීම් කටයුතු සිදු කළ යුතුය. පුහුණුවීම් අත්පොතේ විවිධ මට්ටමේ කාර්ය මණ්ඩල සඳහා විවිධ විෂයමාලා තිබිය යුතු ය. පුහුණු කළමනාකරු විසින් පුහුණු වැඩ සටහනක් අවසන් කළ යුතු අතර අදාළ පුහුණුව පැවැත්වූ කාලසීමාව සහ සහභාගී වූ අයගේ නම් සටහන් කර ගත යුතු ය. ඒ අනුව කලින් කළ කාර්ය මණ්ඩලයේ හැකියාවන් පරීක්ෂා කළ යුතුය. | 50 |
| 17. | පරිසරය ජනතාව සහ රඳා පැවතීමේ හැකියාව | 1. මධ්‍යම පරිසර අධිකාරිය මගින් අනුමත කරන ලද සහ යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යනු ලබන මලාපවහන සහ අපජලය සඳහා බෙහෙත් යෙදීමේ යන්ත්‍රාගාරයක්/පද්ධතියක් හෝටලය සතුව පැවතිය යුතු ය. ඵලදායී ලෙස ජල පරිභෝජනය අඩු කිරීම සඳහා ලද අප ජලය ප්‍රතිචක්‍රීකරණය කළ යුතු ය. යන්ත්‍රාගාරය සඳහා කාර්ය සාධන පරීක්ෂණ සහතික තිබිය යුතු ය. | 25 |
| | | 2. උණු ජලය ලබා ගැනීම සඳහා සූර්ය තාපයෙන් ජලය උණු කිරීමේ ක්‍රමය යොදා ගත යුතු ය. | 25 |
| | | 3. වායුවෙන් සිසිල්වන වායු සමන පද්ධතිවලින්, උණුසුම් පොම්ප පද්ධතිවලින් වාතයේ සිට ජලයට තාපය හුවමාරු කර ගැනීම වැනි උණුදිය නිෂ්පාදනය සඳහා වූ ඵලදායී බලශක්ති පිරිමැසීමේ ක්‍රම යොදා ගත යුතු ය. | 25 |

IV උපලේඛනය (සම්බන්ධිතයි)

*ඕනෑම තරු වර්ගයකට අයත් සංචාරක හෝටල් සඳහා විධානාත්මක නොවන නියම*

| *අංකය* | *I වැනි තීරුව ප්‍රදේශය* | *II වැනි තීරුව පහසුකම්* | *III වැනි තීරුව ලකුණු* |
|---|---|---|---|
| | | 4. විකල්ප හා පුනර්ජනනය කළ හැකි ඉන්ධන සහ/හෝ බලශක්ති ප්‍රයෝජනයට ගත යුතු ය. (උදාහරණ ඉන්ධන වශයෙන් ග්‍රිසීඩියා, විදුලිබල උත්පාදනය සඳහා සුළං බලශක්තිය යොදා ගත යුතු ය. | 25 |
| | | 5. ඵලදායී බලශක්ති සංරක්ෂණ පියවර ක්‍රියාත්මක කළ යුතු ය. මෙම පියවරවල ඵලදායී බල යොදා ඓතිහාසික දත්තයන් යොදා ගත යුතු ය. | 25 |
| | | 6. අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ක්‍රමයක් තිබිය යුතු ය. ආහාර අප ද්‍රව්‍ය පොහොර සෑදීම සඳහා යොදා ගත යුතු ය. නැතහොත් සත්ව ආහාර ලෙස යොදාගත යුතු ය. ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා වෙන්කර ගත යුතු ය. ප්‍රතිචක්‍රීකරණය සඳහා වෙන් කරන ලද අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පැහැදිලි වැඩ පිළිවෙළක් තිබිය යුතු ය. | 25 |
| | | 7. ප්ලාස්ටික්, පොලිතීන් සහ Pvc භාවිතය දිරිමත් නොකළ යුතු ය. ඉහත කී අයිතමයන්ගේ භාවිතය අවම කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් තිබිය යුතු ය. වීදුරු බෝතල්, වීදුරු බඳුනක් වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි භාජන භාවිතය දිරිමත් කළ යුතු ය. | 25 |
| | | 8. අවට වෙසෙන ජනතාවට ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමයක් තිබිය යුතු ය. පුද්ගලයන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය ඉහත කී ක්‍රියාවලිය අර්ථවත් වන පරිදි සකස් කළ යුතු ය. | 25 |
| | | මුළු ලකුණු ප්‍රමාණය | 5,000 |

05 - 74/2

---

එල්. ඩී. බී. 9/2005.

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් මත 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 49 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 69 වැනි වගන්තිය යටතේ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජොන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය.

2016 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2016 අංක 02 දරන සංචාරක (සංචාරක, හෝටල්, විනය නීති සංග්‍රහය) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2016 මැයි 20 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. ලියාපදිංචි සංචාරක හෝටලයක ලියාපදිංචි අයිතිකරු විසින් එම ලියාපදිංචි සංචාරක හෝටලය වෙත පැමිණෙන සෑම සංචාරකයකු පිළිබඳව ම පහත සඳහන් තොරතුරුවලින් සමන්විත වන රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

(අ) පැමිණි තැනැත්තාගේ නම, දිනය සහ වේලාව ;

(ආ) විදේශ ගමන් බලපත්‍ර අංකය ;

(ඇ) ජාතිකත්වය ;

(ඈ) ස්ථිර ලිපිනය ;

(ඉ) තැපැල් යොමු කිරීම් කළ යුතු ඊළඟ ලිපිනය ;

(ඊ) කාමර අංකය ;

(උ) පිටත් වූ දිනය සහ වේලාව ;

(ඌ) බිල්පත් මුදල සහ ගෙවීම් කරන ලද මුදල් ඒකකය ;

(එ) අත්සන ; සහ

(ඒ) එහි ඇතුළත් කරනු ලැබිය යුතු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු.

3. (1) යම් ලියාපදිංචි සංචාරක හෝටලයක් විසින් සපයනු ලබන සේවා සහ පහසුකම් සඳහා සංචාරකයින් විසින් ගෙවීම් කරනු ලබන ක්‍රමය සහ ආකාරය වෙන්ම එකී ගෙවීම් භාරගනු ලබන ක්‍රමය සහ ආකාරය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා කලින් කල නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.

(2) මෙම නියෝගවල (1) වැනි ඡේදය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන යම් විධාන ඇත්නම් එම විධාන (420 වැනි අධිකාරය වූ) මුදල් පනත සහ (423 වැනි අධිකාරය වූ) විනිමත පාලන පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ විධානවලට අනුකූල විය යුතු ය.

(3) මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු හෝ මෙම නියෝගවල සඳහන් විධිවිධාන උල්ලංඝනය කරමින් ගෙවීම් ඉල්ලා සිටිනු ලබන හෝ භාරගනු ලබන හෝටලයක ලියාපදිංචි අයිතිකරුවකු සහ තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

4. (1) යම් ලියාපදිංචි සංචාරක හෝටලයක ලියාපදිංචි අයිතිකරු විසින් -

(අ) පරිසරය ආරක්ෂා කිරීම හා සම්බන්ධ නීති උල්ලංඝනය නොවන ආකාරයට ;

(ආ) ශ්‍රී ලාංකික සමාජයේ පවත්නා පිළිගත් සදාචාරාත්මක සංකල්ප සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන්ට පැටහැනි නොවන සේ ඒවා උල්ලංඝනය නොවන ආකාරයට ; සහ

(ඇ) එකී හෝටලය සම්බන්ධව ප්‍රදානය කරන ලද ලියාපදිංචි සහතික පත්‍රයේ බලපත්‍රයේ සහ වර්ගීකරණ සහතික පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුව ඉහළ ප්‍රමිතියක් සහ ඉහළ පහසුකම් පවත්වා ගනිමින් පාරිභෝගිකයනක් වෙත සේවය සැලසෙන ආකාරයට.

ස්වකීය ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් ලියාපදිංචි අයිතිකරුවෙකු වරදකට වරදකරු වන්නේ ය.

(3) මෙම නියෝගවල සඳහන් විධිවිධාන උල්ලංඝනය වී ඇති බවට සලකනු ලබන අවස්ථාවක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි හෝ තමා වෙත ලැබුණු පැමිණිල්ලක් අනුව ලියාපදිංචි අයිතිකරු වෙත පූර්ව දැනුම්දීමකින් තොරව විභාගයක් පැවැත්වීමට හෝ ස්ථාන පරීක්ෂණය සිදු කිරීම කරනු ලැබිය හැකි ය.

5. (1) මෙම නියෝග යටතේ යම් සංචාරක හෝටලයක් විසින් ලියාපදිංචිය ලබාගෙන නොමැති අවස්ථාවක දී -

(අ) තනිවම හෝ වෙනත් යම් වචන හෝ අකුරු සමග සංයෝගීව "ලියපදිංචි සංචාරක හෝටලය" යන වචන හෝ " සංචාරක හෝටලය" වන වචන ඇතුළත්වන යම් නමක් හෝ තත්ත්වයක් භාවිත කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම ; හෝ

(ආ) එය සංචාරක හෝටලයක් හෝ ලියාපදිංචි සංචාරක හෝටලයක් බවට අගවමින් යම් නමක්, තත්ත්වයක් එකතු කිරීමක් හෝ විස්තරයක් භාවිත කිරීම.

වරදක් වන්නේ ය.

(2) මෙම නියෝගවල කාර්යය සඳහා, යම් ලියාපදිංචි සංචාරක හෝටලයක් විසින් ප්‍රචාරක කාර්යය සඳහා එකී හෝටලය විසින් ප්‍රයෝජනයට ගැනීම සඳහා යම් සංකේතයක හෝ අත්පත්‍රිකාවක. පත්‍රිකාවක, පෝස්ටරයක, දැන්වීමක, සංකේතයක, ලාංඡනයක හෝ වෙනත් යම් සාධන පත්‍රයක "සංචාරක හෝටලය" හෝ "ලියාපදිංචි සංචාරක හෝටලය" යන වචන භාවිත කිරීම සඳහා හිමිකමක් තිබිය යුතු ය.

(3) මෙම නියෝගලවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

05 - 74/3

---

එල්. ඩී. බී. 9/2005.

**2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදෙස් මත 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (3) සහ (6) වන උපවගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 69 වන වගන්තිය යටතේ සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග,
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි
ආගමික කටයුතු අමාත්‍ය.

2016 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

1. මෙම නියෝග 2016 අංක 03 දරන සංචාරක (සංචාරක හෝටල් ලියාපදිංචි කිරීමේ සහ ඒ සඳහා බලපත්‍ර ලබා දීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2016 මැයි මස 20 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

2. (1) සංචාරක හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු විසින් මේ නියෝග ප්‍රකාරව පිළිවෙළින් එම සංචාරක හෝටලය ලියාපදිංචි සංචාරක හෝටලයක් වශයෙන් සහ එම තැනැත්තා ලියාපදිංචි අයිතිකරු වශයෙන් ලියාපදිංචි වී ඇතිනම් මිස කිසිම තැනැත්තකු විසින් සංචාරක ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා කිසිම පරිශ්‍රයක් භාවිත කරනු නොලැබිය යුතු ය.

(2) සංචාරක හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙනයෑමේ කාර්යය සඳහා සෑම ලියාපදිංචි අයිතිකරුවකු ම විසින් (1) වන ඡේදය යටතේ වූ ලියාපදිංචි දින සිට දින හැටක් ඇතුළත මෙම නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව බලපත්‍රයක් ලබා ගත යුතු ය.

## I වැනි කොටස

***සංචාරක හෝටල් ලියාපදිංචි කිරීම***

3 . (1) 2වන නියෝගය යටතේ ලියාපදිංචිය සඳහා කරන ලද සෑම ඉල්ලීමක් ම -

(අ) තත්කාර්ය සඳහා සපයන ලද ආකෘතියට සාරානුකූලව (මෙහි මින් මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) එකී පරිශ්‍රයේ සංචාරක හෝටල් ව්‍යාපාරක් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරනු ලබන තැනැත්තා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය;

(ඇ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමය ප්‍රකාර ගෙවනු ලැබිය යුතු ගෙවීම් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලීම පිළිබඳ සලකා බැලීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලැබිය හැකි යම් පැහැදිලි කිරීම් ද ඇතුළුව යම් තවදුරටත් වූ තොරතුරු හෝ ලේඛන සපයන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

4. 2016 අංක 01 දරන සංචාරක (සංචාරක හෝටල්වල අවම ඉඩප්‍රමාණ සහ පහසුකම්) රීතිවල නිශ්චිතව දක්වා ඇති සියලුම ප්‍රභේදවල සංචාරක හෝටල් සඳහා වූ අවම අවශ්‍යතා සමඟ යම් සංචාරක හෝටලයක් එකඟව ක්‍රියා කරන්නේ ද යන්න විමසා බැලීමේ අරමුණින් අදළ ඉල්ලීම අදළ වන්නා වූ ද සංචාරක හෝටලයක් වශයෙන් ලියාපදිංචි කිරීමට අදහස් කරනු ලබන්නා වූ ද යම් සංචාරක හෝටල් පරිශ්‍රයකට අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ඕනෑම ව්‍යාපාරික කටයුතු සිදු කරන කාලයක් තුළ දී පූර්ව දැනුම් දීමක් ඇතිව හෝ නොමැතිව ඇතුල්විය හැකි ය.

5. (1) ඉල්ලීමක් ලැබීමේ දී හා ඉල්ලුම්කරු සන්තකයේ ඉහත කී අවශ්‍යතා ඇති බවට සෑහීමට පත්වීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) පරිශ්‍රය සංචාරක හෝටලයක් වශයෙන් ද ඉල්ලුම්කරු අයිතිකරු වශයෙන් ද ලියාපදිංචි කරනු ලැබිය හැකි ය; සහ

(ආ) සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි අන්තර්ගත වන්නා වූ ද තත්කාර්ය සඳහා සපයන ලද ආකෘතියෙන් වූ ද ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) යම් ඉල්ලීමක සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට අනාවරණය වුවහොත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(3) ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තා කරනු ලැබිය යුතු ය. එකී ඉල්ලීම කරනු ලබන තැනැත්තා වෙත එම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු ඉල්ලීමේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව සන්නිවේදනය කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

(4) මෙම නියෝගයේ (3) වන අනුඡේදය යටතේ තීරණයක් ගැනීමට පෙරාතුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට පෞද්ගලිකව හෝ තත්කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය දෙන ලද යම් නියෝජිතයකු මඟින් කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය.

6. (1) සංචාරක හෝටල් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි අයිතිකරුවන් සම්බන්ධයෙන් වූ තොරතුරු ඇතුළත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන විස්තර අන්තර්ගත සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන ආකෘතියෙන් වූ ''සංචාරක හෝටල් පිළිබඳ රෙජිස්ටරය'' යනුවෙන් හැඳින්වෙන රෙජිස්ටරයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආරම්භකර පවත්වාගෙන යා යුතු ය.

(2) මෙම නියෝගය යටතේ රෙජිස්ටරයෙහි කරන ලද සෑම ඇතුළත් කිරීමක් ම ''ලියාපදිංචි කිරීමේ සටහනක්'' වශයෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

7. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි හෝ ලියාපදිංචි අයිතිකරු හෝ ලියාපදිංචි සංචාරක හෝටලයක් විසින් තත්කාර්ය සඳහා තමා වෙත කරන ලද නියෝජනයක් මත එම ලියාපදිංචි අයිතිකරුට කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසුව ලියාපදිංචි කිරීමේ සහතිකයට අමුණා ඇති යම් නියම හෝ කොන්දේසි සංශෝධනය කිරීම, නවීකරණය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නැතහොත් එයට යම් අලුත් නියමයක් හෝ කොන්දේසියක් ඇතුළත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) ඉහත (1) වන ඡේදය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ලියාපදිංචි කිරීමේ සටහනක ඇති යම් විස්තර සංශෝධනය කරනු ලබන හෝ ප්‍රතිශෝධනය කරනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ලියාපදිංචි සහතිකයේ අවශ්‍ය සංශෝධන කිරීමට තමන්ට හැකි වන පරිදි එම ලියාපදිංචි සහතිකය තමා වෙත සපයන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි අයිතිකරු වෙත ලිඛිත නිවේදනයක් මඟින් නියම කරනු ලැබිය හැකි ය. එහි දක්වා ඇති කාලසීමාව තුළ එම නියමයට අනුකූලව ක්‍රියාකිරීම ලියාපදිංචි අයිතිකරුගේ කාර්යය විය යුතු ය.

8. (1) 5 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රයක් පහත දැක්වෙන අවස්ථාවලදී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි යː-

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධාන යටතේ හෝ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන යටතේ හෝ එම පනත යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති යටතේ යම් වරදක් සිදු කිරීමේ දී ලියාපදිංචි අයිතිකරුට චෝදනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී;

(ආ) ලියාපදිංචි අයිතිකරු විසින් 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ හෝ 1968 අංක 14 සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන යටතේ වූ යම් නියෝග හෝ රීති උල්ලංඝනය කිරීම මඟින් ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීමක් සඳහා අවසර ලබා නොදෙන අවස්ථාවක දී; හෝ

(ඇ) සංචාරක හෝටලයක් වශයෙන් ලියාපදිංචි කරන ලද යම් පරිශ්‍රයක් සංචාරක හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමේ කාර්යයක් නොවන වෙනත් යම් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන අවස්ථාවක දී.

(2) මෙම නියෝගය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අත්හිටුවනු ලැබ ඇති අවස්ථාවක දී, ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම සඳහා තමා විසින් ගෙවන ලද ගාස්තුව සමානුපාතිකව ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ලියාපදිංචි අයිතිකරුට හිමිකමක් ඇත්තේ ය.

9. මෙම නියෝගවල ඉහතින්ම වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොසළකා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය අභිමතය පරිදි මෙම නියෝග යටතේ සංචාරක හෝටලයක් වශයෙන් යම් පරිශ්‍රයක් ලියාපදිංචි කරන ලෙස එම පරිශ්‍රයේ අයිතිකරුට විධාන කරනු ලැබිය හැකි ය.

10. යම් හෝටලයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය හෝටලය ඇතුළත ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම යම් ලියාපදිංචි සංචාරක හෝටලයක ලියාපදිංචි අයිතිකරුගේ කාර්යය විය යුතු ය.

## II වැනි කොටස

### *ලියාපදිංචි සංචාරක හෝටල් සඳහා බලපත්‍ර ලබාදීම*

11. (1) ලියාපදිංචි සංචාරක හෝටලයක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ මෙම නියෝගවල 2 වන නියෝගයේ (2) ඡේදය යටතේ වූ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක් ම -

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා සපයනු ලබන ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබීය යුතු ය.

(ආ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ කරන ලද නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ බලපත්‍ර ගාස්තුව ද සමඟ විය යුතු ය; සහ

(ඇ) එම සංචාරක හෝටලයේ ලියාපදිංචි අයිතිකරු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රය නිකුත් කිරීම සඳහා නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත ඉල්ලුම්පත්‍රයට අදළ තවදුරටත් වූ තොරතුරු, ලේඛන හෝ පැහැදිලිකිරීම් සපයන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරුට විධාන කරුනු ලැබිය හැකි ය.

12. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව, එකී ලියාපදිංචි සංචාරක හෝටලය සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) ඉහත (1) වන අනුජේදය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් -

(අ) මේ නියෝගවල විධිවිධානවලට යථා පරිදි එකඟව ක්‍රියාකිරීම ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත යැයි සලකනු ලබන බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලබන නියම සහ කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) එහි නිශ්චිතව සඳහන් දිනයේ දී බලාත්මක විය යුතු ය; සහ

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් අවලංගු කළහොත් හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබුවහොත් මිස, බලපත්‍රයේ නිශ්චිතව සඳහන් දින සිට එක් අවුරුදු කාලයක් සඳහා වලංගු විය යුතු ය.

13. ඉල්ලුම්කරු විසින් -

(අ) මේ නියෝගවල 2 වන නියෝගය යටතේ පරිශ්‍රය ලියාපදිංචි කිරීම හෝ තමා ලියාපදිංචි අයිතිකරු ලෙස ලියාපදිංචි අයිතිකරු ලෙස ලියාපදිංචි කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී;

(ආ) මේ නියෝගවල 5 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති යම් නියමයකට සහ කොන්දේසියකට එකඟ ක්‍රියාකිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී ;

(ඇ) ඉල්ලීම් කරන ලද වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂය ඇතුළත 2005 අංක 38 සංචාරක කටයුතු පනතේ හෝ 1968 අංක 14 දරන සංචාරක සංවර්දන පනතේ යම් විධිවිධානයක් හෝ එම පනත් යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති උල්ලංඝනය කිරීමේ හේතුවෙන් වරදකට වරදකරු වී ඇති අවස්ථාවක දී ; හෝ

(ඈ) මෙම නියෝගවලට 12 වැනි නියෝගයේ නිශ්චිතවය දක්වා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී,

මෙම නියෝගවල 12 වැනි නියෝගය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රයක් ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

14. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමයක් මගින් මෙම නියෝගවල 12 වැනි නියෝගය යටතේ ලියාපදිංචි සංචාරක හෝටලයක් සඳහා නිකුත් කර ඇති යම් බලපත්‍රයක් ප්‍රත්‍යාෂ්ඨ කිරීම හෝ අත්හිටුවීම පහත දැක්වෙන අවස්ථාවල දී කරනු ලැබිය හැකි ය :

(අ) 2005 අංත 38 සංචාරක කටයුතු පනතේ හෝ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ යම් විධිවිධාන හෝ එම පනත් යටතේ සාදන ලද මේ නියෝග හෝ රීති උල්ලංඝනය කිරීමේ හේතුවෙන් ලියාපදිංචි අයිතිකරු වරදකට වරදකරු වී ඇති අවස්ථාවක දී ; හෝ

(ආ) බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති යම් නියම හෝ කොන්දේසිවලට එකඟව ක්‍රියාකිරීම ලියාපදිංචි අයිතිකරු විසින් උල්ලංඝනය කර ඇති අවස්ථාවකදී හෝ එසේ කිරීම පැහැර ඇති අවස්ථාවක දී ;

(ඇ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 53 වැනි වගන්තිය යටතේ සාදන ලද මිල නියාමන නියමයට අනුකූල නොවන අවස්ථාවක දී.

(2) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවකදී, එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තාගත කරනු ලැබිය යුතු ය. එම ප්‍රතික්ෂෙප කිරීම සඳහා වූ හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලීමේ සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලිඛිතව සන්නිවේදනය කිරීම මගින් එකී ඉල්ලීම කරනු ලබන තැනැත්තා වෙත දැනුම්දීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

15. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය මතය අනුව හෝ බලපත්‍රයක් දරනු ලබන යම් ලියාපදිංචි අයිතිකරුවකු විසින් තත්කාර්ය සඳහා කරන ලද යම නියෝගයක් අනුව එම ලියාපදිංචි අයිතිකරු වෙත සවන්දීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසුව බලපත්‍රයට සම්බන්ධ කර ඇති යම් නියම හෝ කොන්දේසි සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම නැතිනම එයට යම් අලුත් නියම හෝ කොන්දේසි සම්බන්ධ කිරීම කරනු ලැබිය හැකි ය.

16. ලියාපදිංචි සහතිකයේ හෝ බලපත්‍රයේ අනුපිටපතක් ඉල්ලුම් කරනු ලබන සැම ලියාපදිංචි අයිතිකරුවෙකුම මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

## III වැනි කොටස

### *සාමාන්‍ය*

17. ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් -

(අ) ලියාපදිංචි කළ සහ බලපත්‍ර ප්‍රදානය කරන ලද සංචාරක හෝටල්වල නම් ; සහ

(ආ) මෙම නියෝගවල විධිවිධාන යටතේ බලපත්‍ර ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති සංචාරක හෝටල්වල නම්,

ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

18. (1) 5 වැනි නියෝගය යටතේ යම් ලියාපදිංචි සංචාරක හෝටලයක ලියාපදිංචිය ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති අවස්ථාවක දී, 12 වැනි නියෝගය යටතේ එම හෝටලය සම්බන්ධයෙන් නිකුත් කරන ලද බලපත්‍රය සියලු කාර්ය සඳහා බලාත්මකවීම අවසන් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මෙම නියෝග යටතේ යම් ලියාපදිංචි සංචාරක හෝටලයක ලියපදිංචිය අත්හිටුවා ඇති අවස්ථාවක දී, මෙම නියෝග යටතේ එම හෝටලය සම්බන්ධයෙන් නිකුත් කරන ලද බලපත්‍රය එම අත්හිටුවන ලද කාලසීමාව ඇතුළත බලාත්මකවීම අවසන් කරනු ලැබිය යුතු ය.

19. (1) මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීමක් හෝ බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමෙ නියමයක් කිරීමට පෙර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි අයිතිකරුට නිවේදනයක් නිකුත් කිරීමෙන් පසුව විමර්ශණයක් පැවැත්වීම සඳහා එම අයිතිකරුට පෞද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකු මගින් ලිඛිතව කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය.

(2) එකී සංචාරක හෝටලයේ අයිතිකරුට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව දැනුම් දී ඇත්නම් මිස බලපත්‍රය අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා කිසිඳු නියෝගයක් කරනු නොලැබිය යුතු අතර. කල් අවසන් වීමට පෙර ලියාපදිංචි අයිතිකරු විසින් එකී නිවේදනයේ නිශ්චිතව දැක්වෙන පියවර ගෙන නොමැති නම් එකී නිවේදනයේ සඳහන් කාලසීමාව අවසන් වීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවීමේ හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නියමයක් කරනු ලැබිය යුතු ය.

20. අවස්ථාවෝචිත පරිදි යම් ලියාපදිංචි සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නිකුත් කළ යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ බලපත්‍රයක් අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි එම ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම තමා වෙත දැනුම් දෙනු ලබන ලිඛිත සන්නිවේදනය ලැබී දින තිහක් ඇතුළත් 1982 ජුලි 27 වැනි දින අංක 296/6 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 අභියාචන විනිශ්චය අධිකාර නියෝග මගින් පිහිටුවා ඇති අභියාචන විනිශ්වය අධිකාරියක් වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

### උපලේඛනය

(16 වැනි නියෝගය)

*අනුපිටපත් නිකුත් කිරීම සඳහා අයකරන ගාස්තු*

| *වර්ගය* | *ගාස්තුව රුපියල්* |
|---|---|
| ලියාපදිංචි කිරීමේ සහතිකය | 5.000 |
| බලපත්‍රය | 5.000 |

05 - 74/4

---

එල්. ඩී. බී. 9/2005.

## 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 48 වැනි වගන්තියේ (8) වැනි උපවගන්තිය සමග කියවිය යුතු සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද එම පනතේ 62 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සාදන ලද නියෝග.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,
(ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා සහ
වෙනුවෙන් අත්සන් කරන ලදී.)

2016 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

### රීති

1. මෙහි රීති 2016 අංක 01 දරන සංචාරක (සංචාරක හෝටල්වල් අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම්) රීති යනුවෙන් හඳුන්වනු ලබන අතර 2016 මැයි 20 වැනි දින සිට බලාත්මකභාවයට පැමිණිය යුතු ය.

2. සංචාරක හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමට අරමුණු කරන සෑම තැනැත්තකු විසින්ම මෙහි උපලේඛනයේ I වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි එවැනි සංචාරක හෝටලයක හඳුනාගත් එක් එක් ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම්වලට අනුකූලව ඒ සංචාරක හෝටලය, අංගෝපාංගයන්ගෙන් සමන්විත විය යුතු බවට සහතික විය යුතු ය.

**උපලේඛනය**

***සියලුම කාණ්ඩයේ සංචාරක හෝටල් සඳහා තිබිය යුතු අවම අවශ්‍යතාවයන්***

| *අංකය* | *I වැනි තීරය*<br>*හඳුනාගත් ක්ෂේත්‍ර* | *II වැනි තීරය*<br>*අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම්* |
|---|---|---|
| 1. | හෝටල් ගොඩනැගිලි | 1. හෝටලය තුළ අවම වශයෙන් යාබද නානකාමර සහිතව නිදන කාමර 10ක් තිබිය යුතු ය.<br>2. හෝටලය තුළ වෙනම සේවා පිවිසුමක් තිබිය යුතු ය. |
| 2. | ප්‍රධාන සේවා | 1. හොඳ තත්ත්වයෙන් යුතු ජලය ප්‍රමාණවත්ව සැපයිය යුතු ය.<br>2. සියලු අමුත්තන්ගේ කාර්යයන් සහ පරිභෝජනය සඳහා භාවිත කරන ජලය බීමට යෝග්‍ය ජලය බවට ශ්‍රී ලංකා රජයේ ප්‍රමිති ආයතනය විසින් සහතික කළ යුතු ය.<br>3. බිම් මහල ද ඇතුළුව මහල් තුනකට වැඩි හෝටලයක හෝ ගොඩනැගිල්ලක අමුත්තන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් පරිදි අමුත්තන් සඳහා සෝපානයක්/සෝපාන තිබිය යුතු ය. |
| 3. | නිදන කාමර | නිදන කාමරයේ ප්‍රමාණය (යාබද සඳළුතලය හා වැසිකිළිය හැර) පහත පරිදි විය යුතු ය.<br>1. තරු පහ, හතර සහ තුන්වන වර්ග සඳහා - අවමය වර්ග මීටර් 22.0<br>2. තරු දෙක සහ එක වර්ග සඳහා - අවමය වර්ග මීටර් 17.0<br>3. කාමරයක පළල මීටර් 3.0ට නොඅඩු විය යුතු ය. (යාබද සඳළුතලය සහ වැසිකිළිය හැර) |
| 4. | දොර අගුළු | නිදන කාමරයට නැති ඇති ප්‍රධාන පිවිසුම් දොර ඇද වසන විට ස්වයංක්‍රියව ඇගුලු වැටිය යුතුය. |
| 5. | හදිසි දොරටු | හදිසි දොරටු මාර්ගය දැක්වෙන ගොඩනැගිල්ලේ සැලැස්මක් පිවිසුම් දොරටුව ඇතුළු පැත්තේ මතු පිටත ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය. |
| 6. | නාන කාමර | 1. සෑම නාන කාමරයක්ම අවම වශයෙන් හතරැස් අඩි 3.7ක ප්‍රදේශයකින් යුක්ත විය යුතු ය.<br>2. නාන කාමරයෙන් නික්මෙන අපවිත්‍ර වාතය ඉවත් කිරීමට ස්වභාවික හෝ යාන්ත්‍රික උපක්‍රමයක් යෙදිය යුතු ය. |
| 7. | ගෘහ පාලනය | 1. බාධා රහිත සහ කාර්යක්ෂම ආගන්තුක සේවාවක් සඳහා උණුසුම් සහ සිසිල් ජලය ගලාඑන විශාල ප්‍රමාණයේ ගෘහ පාලන ගබඩා ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයිය යුතු ය.<br>2. මෙම පහසුකම් සැපයීම සම්බන්ධයෙන් සීමිත අවකාශ තිබෙන හෝටල් අදාළ කර්තව්‍යයන් කරගෙන යාමට නිදන කාමරයට ඉතා අසන්නයෙන් විකල්ප සැලසුමක් සෑදිය යුතු ය. |
| 8. | භෝජනාගාර සහ මත්පැන් හල් | නේවාසික අමුත්තන් සඳහා භෝජනාගාර පහසුකම් තිබිය යුතු ය. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *අංකය* | *I වැනි තීරය* *හඳුනාගත් ක්ෂේත්‍ර* | *II වැනි තීරය* *අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම* |
|---|---|---|
| 9. | බොජුන්පත් | A-la Carte බොජුන්පත් තිබිය යුතු ය. |
| 10. | ශීතකරණ | බාර් තුළ ප්‍රමාණවත් ශිතකරණ පහසුකම් පැවතිය යුතු ය. |
| 11. | මුළුතැන්ගෙය | 1. වාතාශ්‍රය ලැබීම සඳහා සහ රත් වූ දුම සහ දුර්ගන්ධය ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන සකසා තිබිය යුතු ය. |
| | | 2. සබන් හා අත් සේදීම සඳහා වෙන් වෙන් පහසුකම් සහ බැහැර කළ හැකි කඩදාසි අත්පිස්නා හෝ තුවා නැතහොත් උණුසුම් වාතය මගින් අත්වියලන යන්ත්‍රයක් කාර්ය මණ්ඩලය මුළුතැන්ගෙට පිවිසෙන ස්ථානයේ තැබීමට සැලැස්විය යුතු ය. |
| | | 3. විශේෂයෙන් වළං සහ ඇතිලි සේදීම සඳහා උණුසුම් සහ සිසිල් ජලය මිශ්‍රව ගලා එන ජලය කරාමයකින් යුතු මලනොබැඳෙන වානේවලින් සෑදූ සේදුම් ජල බේසමකින් යුතු වෙන් වශයෙන් වෙන් කෙරුණ ප්‍රදේශයක් ඉහුම් පිහුම් කරන ස්ථානයෙන් දුරස්ථව පිහිටි තිබිය යුතු ය. |
| 12. | ගබඩා කිරීම | 1. සියලුම අධිශීතකරණ සහ ශීතකරණ නිවැරදි උෂ්ණත්වයකින් පවත්වාගෙන යා යුතු ය. |
| | | 2. කිරි නිෂ්පාදන සහ සකස්කළ ආහාර, මස් සහ මුහුදු ආහාරවලින් වෙන්කර ගබඩා කළ යුතුයි |
| | | 3. ආහාර ගබඩා භෞතික වශයෙන් අනෙකුත් ගබඩා ප්‍රදේශවලින් වෙන්ව තැබිය යුතු ය. |
| | | 4. කල්තබා ගත නොහැකි දෑ ශීතෝෂ්ණ පාලන ප්‍රදේශයක ගබඩා කළ යුතු ය. |
| | | 5. සිල්ලරට සහ වියළි ආහාර ඒවායේ සුවඳ සහ රස කලවම්වීම වැළැක්වීමට වෙන් වෙන්ම ගබඩා කළ යුතු ය. |
| | | 6. අධිශීත කුටිවල සහ ශීත කුටිවල ඇතුළත භාවිත කරන රාක්ක මලනොබැඳෙන වානේ හෝ ලෝහ නොවන ද්‍රව්‍යයන්ගෙන් සාදනු ලැබිය යුතු ය. |
| | | 7. බීම ගබඩා හෝ මත්පැන් සහ වයින් ගබඩා කිරීම සඳහා වූ පහසුකම් නිවැරදි ගබඩා උෂ්ණත්වයක තැබිය යුතු ය. |
| | | 8. ලිපි ද්‍රව්‍ය, යාන්ත්‍රික අයිතම ආදී වශයෙන් වූ විවිධ ද්‍රව්‍ය භෞතිකව වෙන්කළ ප්‍රදේශවල ගබඩා කළ යුතු ය. |
| | | 9. තීන්ත සහ වාෂ්පශීලී ද්‍රව්‍ය ගොඩනැගිල්ලේ හොඳින් වාතාශ්‍රය ලැබෙන ප්‍රදේශයක වෙන් වශයෙන් ගබඩා කරනු ලැබිය යුතු ය. |
| | | 10. රසායන ද්‍රව්‍ය ගබඩා වෙන්ව තිබිය යුතු ය. |
| 13. | සනීපාරක්ෂක අවශ්‍යතා | 1. වියළි අපද්‍රව්‍ය බැහැර කරන තෙක් ආවරණය කරන ලද වාතාශ්‍රිත තත්ත්වයක ගබඩාකළ යුතු ය. |
| | | 2. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය මුල් අවස්ථාවේ දී වර්ගකර ගබඩා කළ යුතු අතර වෙන්ව බැහැර කළ යුතු ය. |
| | | 3. තෙත අපද්‍රව්‍ය ආවරණ කරන ලද පෙදෙසක වෙනමම ගබඩා කළ යුතු ය. |

උපලේඛනය (සම්බන්ධිතයි)

| අංකය | I වැනි තීරය<br>හඳුනාගත් ක්ෂේත්‍ර | II වැනි තීරය<br>අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම |
|---|---|---|
| 14. | ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය | 1. හෝටලයේ ගොඩනැගිල්ල සහ ගිනිනිවීමේ උපකරණ දේශීය නියමයන්ට අනුකූල විය යුතු ය.<br><br>2. ගිනි සහතිකය වාර්ෂිකව ජාතිකව පිළිගත්/අනුමත ගිනිනිවීමේ අධිකාරියකින් ලබා ගත යුතු ය.<br><br>3. කාර්යය මණ්ඩලයෙන් අඩුව වශයෙන් 75% ප්‍රමාණයකටවත් ප්‍රථමාධාර සහ ගිනි නිවීම පිළිබඳ පුහුණුව ලබා දිය යුතු ය.<br><br>4. හදිසි අවස්ථාවක දී පිටවීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව සාදන ලද සංඥා ඇතුළු අනතුරු ඇඟවීමේ විදුලි පහන් හෝටලයේ සෑම ප්‍රදේශයකටම සැපයිය යුතු ය.<br><br>5. මුහුද ආසන්නයේ හෝටල් සහ පිහිනුම් තටාකයන් සහිත හෝටල් භාවිත කරන්නන්ගේ ආරක්ෂාව සඳහා පූර්ව ආරක්ෂාකාරී ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.<br><br>6. ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව අවවාද සහ අනතුරු ඇඟවීමේ සංඥා ප්‍රකටම පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු ය.<br><br>7. අකුණු පහරවල් වැළැක්වීමට ආරක්ෂිත පියවර ගනු ලැබිය යුතු ය.<br><br>8. ප්‍රථමාධාර පහසුකම් පැවතිය යුතු ය.<br><br>9. හදිසි අවස්ථවක දී කැඳවීම සඳහා පැය 24 පුරාම වෛද්‍යවරු සිටිය යුතු ය.<br><br>10. පොදු වත්කම් සහ සේවක වන්දි ගෙවීම ඇතුළුව හෝටල්කරුවන්ගේ පූර්ණ රක්ෂණ ඔප්පුවක් මගින් හෝටලය ආවරණය කළ යුතු ය. |
| 15. | පිහිනුම් තටාක | 1. ගැඹුර පිළිබඳ සළකුණු සහ ජාත්‍යන්තරව පිළිගත් ආරක්ෂාව පිළිබඳ සංඥා පිහිනුම් තටාකය අසල ස්ථිර වශයෙන් ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.<br><br>2. පිහිනුම් තටාකයක් පවතින විට, ජලයේ තත්ත්වය ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්ට අනුව පවත්වාගෙන යා යුතු ය.<br><br>3. ජලයේ තත්ත්වය පිළිබඳ අඩුම වශයෙන් දිනකට දෙවතාවක්වත් පරීක්ෂාකර බලා වාර්තා කළ යුතු ය.<br><br>4. පහත දැක්වෙන පරාමිතියට අනුව පිහිනුම් තටාකයේ ජලයේ තත්ත්වය පවත්වාගෙන යා යුතු ය. pH 7.4 සිට අවශේෂ ක්ලෝරීන් 7.6 දක්වා අවමය 0.5 PPM (1.0 PPM නිර්දේශ කර ඇත.) |
| 16. | සීමාසහිත හැකියාවන් ඇති අමුත්තන් සඳහා වන පහසුකම් | 2006 ඔක්තෝබර් මස 17 වැනි දින අංක 1,467/15 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ සාදන ලද 2006 අංක 01 දරන ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග මගින් සැලසුම් කරන ලද ප්‍රමිතිවලට අනුකූල වීම. |
| 17. | පොදු වැසිකිළි | සීමාසහිත හැකියා ඇති තැනැත්තන්ගෙන්, රෝද පුටු භාවිතකරන්නන් සඳහා අවම වශයෙන් පහසුකම් සහිත එක වැසිකිළියක්වත් තිබිය යුතු ය. |
| 18. | රියදුරන් සඳහා වූ පහසුකම් | රාත්‍රියක දී නතරවන රියදුරන් සඳහා සපයන පහසුකම් ප්‍රමාණවත් විය යුතු ය. සුවපහසු මෙට්ට සහ ඇඳ ඇතිරිලි මෙන්ම වෙන් වූ කෑම ගැනීමේ ස්ථානයක් ද තිබිය යුතු ය. |

| *අංකය* | *I වැනි තීරය හඳුනාගත් ක්ෂේත්‍ර* | *II වැනි තීරය අවම ඉඩ ප්‍රමාණ සහ පහසුකම* |
|---|---|---|
| 19. | කාර්යය මණ්ඩලය | 1. කාර්යය මණ්ඩලයේ සියලු දෙනාම අවුරුද්දකට වරක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය. |
| | | 2. රජයේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් සහතික කරන ලද වෛද්‍ය වාර්තාවක් භාර දිය යුතු ය. |
| | | 3. හොඳින් ක්‍රියාකරන ජල ගබඩා සහිතව වෙන් වශයෙන් වූ පිරිසිදු වැසිකිළි සහ හොඳින් නඩත්තු කරන ලද ෂවර් කාර්යය මණ්ඩලයට ලබා දිය යුතු ය. |
| | | 4. ෂවර් තිබෙන ප්‍රදේශය ද ඇතුළුව වැසිකිළි බිත්ති පාරගම්‍ය නොවන ද්‍රව්‍යයකින් ආවරණය කළ යුතු ය. |
| | | 5. සේදූම් බේසමේ සහ WC ප්‍රදේශයේ අවම උස සෙ.මී. 150ක් විය යුතු අතර ෂවර් තිබෙන ප්‍රදේශය සෙ.මී. 210ක් විය යුතු ය. |
| | | 6. ෂවර් ප්‍රදේශය ඇතුළුව වැසිකිළිවල ඇතුළත පොළොව ලිස්සන සුළු නොවන ද්‍රව්‍යවලින් ආවරණය කළ යුතු ය. |

04 - 74/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.